උදාහරණ :

- නැවත වෙළඳාම - ළමයෙකු ශරීර අවයව ලබා ගැනීමට කරන ලද අවස්ථාවක අනතුරුව නැවත ළමා ශ්‍රමිකයකු ලෙස හෝ සිඟමනේ යෙදවීමේ සිදු කළ හැකි ය.
- ශාරීරික වධ හිංසාව හෝ මිනීමැරීම - දරුවකු වෙළඳාම් කිරීමෙන් අනතුරුව වධහිංසාවට ගොදුරු කිරීම, අමානුෂික නින්දිත සැලකීම්වලට භාජනය කිරීම්, ශාරීරික හිරිහැර සිදු කිරීම හා එහි උග්‍ර අවස්ථාව වන මරණයට පත් කිරීම පශ්චාත් වෙළඳාම් අවස්ථාවේ දී සිදුවිය හැකි ය. විශේෂයෙන් ම දරුවා පාලනය කිරීමට අපහසුවක් හෝ ඔහු පොලිසිය වෙත පැමිණිලි කරතැයි යන බිය මත මෙම ක්‍රියාව සිදු විය හැකි ය.
- අයුතු අවහිරය හෝ නීති විරෝධී රඳවා තබා ගැනීම - වෙළඳාම් කරන්නන් වින්දිත දරුවා අයුතු ලෙස රඳවා තබා ගැනීම හෝ සංචරණය අවහිර කිරීම, දරුවා පලායාමට උත්සහ කරන අවස්ථාවක දී සිදු කරයි.

**උදාහරණ** : *ගැහැණු ළමයින් ගණිකා වෘත්තිය සඳහා වෙළඳාම*

- දරුවන් වෙළඳාමේ හවුල්කරුවන් බවට පත්කර ගැනීම - වෙළඳාම් කරන්නන් තම කර්මාන්තය තුළට වෙළඳාමට ලක්වූ දරුවන් යොදවා ගැනීම
- ළමයින් අපරාධ කිරීම සඳහා යෙදවීම - වෙළඳාමට ලක්වූ දරුවන් වෙළඳාම කළ පුද්ගලයන් විසින් යම් යම් අපරාධ සඳහා යෙදවීම සිදු කරයි. **උදාහරණ** : *අවි ආයුධ ප්‍රවාහනය, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය*

ඉහත සඳහන් කරන ලද වැරදිවලට අමතරව, වෙළඳාම හෝ වෙළඳාම කිරීමේ ක්‍රියාවලිය තුළ
සිදුවන පහත වරදවල් ද නීතිය ඉදිරියේ වරදක් බව අවබෝධ කරගත් යුතු ය.

- වෙළඳාම කරන්නාට භාර දීම උදෙසා ඉතා කෙටි දුරක් වුව ද වින්දිත ළමයා ප්‍රවාහනය කිරීම.
- වෙළඳාම් ක්‍රියාවලිය සිදුවන ස්ථානයක අරක්කැමියකු හෝ ගෘහ පාලකයෙකු ලෙස සේවය කිරීම. වෙළඳාම ක්‍රියාවලියේ එක් අදියරක් ලෙස යොදා ගන්නා බව දනිමින්ම, කුලී පදනම යටතේ පහසුකම් ලබාදීම.
- වෙළඳාමට ලක්වූ දරුවන් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා බව දනිමින්ම කුලී පදනම යටතේ ප්‍රවාහන පහසුකම් සැලැස්වීම.

## 3.4 වෙළඳාමේ ඵල විපාක

වෙළඳාමේ වින්දිතයා වෙත ළමයා තම පවුලෙන්, මිතුරන්ගෙන් හුදකලා වීම සහ/ හෝ ශාරීරික සහ/ මානසික හිරිහැරයට ලක්වීම සිදුවේ. යම් අවස්ථාවල දරුවාගේ හෝ ඔහුගේ/ ඇයගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගේ ජීවිත පවා අවදානමට ලක් වේ. ළමයින් වෙළඳාම් කිරීම අපරාධ මේ වරදක් පමණක් නොව එය දරුවාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ද වේ. වෙළඳාම් කිරීම තුළින් තනි පුද්ගලයන්ට, පවුලට, සමාජයට හා රාජ්‍යයට විවිධාකාර ප්‍රති විපාකයන්ට මුහුණ දීමට සිදුවේ.

- **තනි පුද්ගලයන්ට**

  වෙළඳාම් කරන්නන් තර්ජනකාරී මාධ්‍යන් ඔස්සේ ළමයාගේ සංචලනය සීමා කරන අතර ළමයින්ව ඉතා අවම තත්ත්වයන් යටතේ ජීවත්වීමට, හෝ රැකියාවක නියුතු වීමට පරිසරය නිර්මාණය කරවමින් තම බලපෑම යටතේ රඳවා තබා ගනියි. ශාරීරික හෝ මානසිකමය වශයෙන් ආරක්ෂණ විධීන් අහිමි කරවමින්, දරුවන් පලා යාම වැළැක්වීම සඳහා වෙළඳාම් කරන්නන් කටයුතු සිදුකරයි. මෙය දරුවාගේ ශාරීරික සහ මානසික සංවර්ධනයට ඉතා හානිදායක ආකාරයට බලපායි.

- **ශාරීරික සෞඛ්‍යමය ගැටලු**

  වෙළඳාමට ලක්වූ ළමා වින්දිතයන් ඔවුන්ගේ මූලික මානව හිමිකමක් වන සෞඛ්‍යට සහ ආරක්ෂණයට ඇති අයිතිය අහිමි වීම අත්විඳියි. වෙළඳාමට ලක්වූ දරුවන් ඉතා අමානුෂික ජීවන තත්වයන් යටතේ රඳවා තබා ගැනීම, සිදුකරයි. ඔවුන්ට ප්‍රමාණවත් තරම් සෞඛ්‍යාරක්ෂිත ආහාර නොලැබී යයි. එලෙසම, ඔවුන් ශාරිරිකමය සහ ලිංගික අඩත්තේට්ටම් හා අපයෝජනයන්ට ලක්වන අතර මේ තුලින් දීර්ඝකාලීන ප්‍රති විපාකයන්ට මුහුණ දීමට ද සිදුවෙයි. එනම්:

- මත්ද්‍රව්‍ය සහ මත් පැන්වලට ඇබ්බැහි වීම: භාවාත්මක ලෙස පෙළඹ වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ වෙළඳාම කරන්නන් විසින් භාවිත කරන මත්ද්‍රව්‍ය භාවිත කිරීමට බලපෑම් කිරීම, බල කිරීම හෝ ශාරීරික අපයෝජනය සඳහා මුහුණ දීමට හෝ මානසික වශයෙන් බලාපොරොත්තු රහිත ස්වභාවයෙන් තාවකාලිකව මිදීමට මේ ආකාරයෙන් ඇබ්බැහිව වීම සිදුවේ.

  - තැල්ම, කැළලි සහ පිළිස්සුම් තුවාල භෞතික අපයෝජන හා වධ දීමේ සලකුණු වශයෙන් ඉතිරි වේ.
  - දරුණු ශාරීරික හිංසනය හේතුවෙන් මතකයට බලපෑම් සිදු වන ආකාරයෙන් මොළයට සිදුවූ හානි.
  - කරකැවිල්ල, හිසේ කැක්කුම සහ හිරි වැටීමේ තත්ත්වයන්
  - පෙණහලු ආශ්‍රිත රෝග - ක්ෂය රෝගය, සෙංගමාලය
  - ඉතා හානිදායක වෛද්‍යමය ක්‍රියාකාරකම් සඳහා දරුවන් යොමු කිරීම හේතුවෙන් සිදුවන ආසාදන තත්ත්වයන් හෝ ශාරීරික විකෘතිතා
  - කල් පවත්නා කොඳු ඇට පේලිය, හෘදවාහිනී, ශ්‍රවණ හෝ ශ්වසන ආශ්‍රිත ගැටලු ඇතිවීම දීර්ඝකාලීන ලෙස කෘෂි කර්මාන්තයේ යෙදෙමින් දැඩි ලෙස වැඩවල යොදන කර්මාන්තවල යෙදවීම, හෝ ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගැනීම හේතුවෙන් ඇති වේ.
  - පෝෂණ ඌනතා සහ බරපතල දන්ත සෞඛ්‍යමය ගැටළු
  - ළමා වින්දිතයන් බොහෝ වේලාවට වර්ධනයේ ඌනතා සහ දුර්වර්ණ වූ දත් යන තත්වයන්ගෙන් පෙළෙයි.
  - අවම විදුලි එළියක් සහිත ස්ථානයන්හි වැඩ කිරීම හේතුවෙන් ඇස් පෙනීම දුර්වල වීම හෝ අක්ෂි රෝගයන්ට ගොදුරුවීම.

**උදාහරණයක් වශයෙන්**, *තායිලන්තයේ ජාතික මානව හිමිකම් කොමිසම 2003 වර්ෂයේ වෙළඳාම් කිරීම ධීවරයන් සිය දෙනෙකුට බලපාන ලද ආකාරය වාර්තා කරන ලදී. වසර ගණනාවක ශ්‍රම සූරාකෑමෙන් අනතුරුව 39 දෙනකු මියගොස් තිබූ අතර නිවාස වෙත නැවත පැමිණි කණ්ඩායම ඉතා දරුණු රෝගී තත්ත්වයන්ට ගොදුරු වී තිබූ අතර මානසිකව කැලඹීමට ලක්වී තිබුණි. දෘශ්ඨි හා ශ්‍රවණය පිළිබඳ ගැටලු සහ ඇවිදීමට නොහැකි වීම යන තත්ත්වයන්ට ද  ගොදුරු වී තිබුණි.*

ඉහත දක්වන ලද ලැයිස්තුවට අමතරව වෙළඳාමට ලක්වූ  ළමයින් ලිංගික සූරාකෑමට ගොදුරුව වන අතර ඒ හේතුවෙන් පහත ආකාරයේ බරපතළ සෞඛ්‍ය ගැටළුවලට ගොදුරු වනු ලැබේ.

- HIV/AIDS ඇතුළුව ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගවලට ගොදුරුවීම.
- ගබ්සාව වීම හෝ බලහත්කාරී ගබ්සාවන්ට ලක් කිරීම. (ස්ත්‍රී දූෂණයට ලක්වීම හෝ ගණිකා සේවයේ යෙදවීම හේතුවෙන් අනවශ්‍ය ගැබ් ගැනීම්වලට ඇති ඉහළ  අවදානම් සහ අනාරක්ෂිත ගබ්සාවන්)
- නිරන්තරයෙන් ම ඉහළ අවදානම් සහිත ගැබ් ගැනීම් තුළින් ඇතිවන සංකූලතා.

රෝගයක් ඇතිවීමට පෙර වළක්වා ගැනීමට සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා දීම මෙම වින්දිත  දරුවන්ට තත්භාවී  ලෙස නොපවතින්නකි.  ප්‍රාථමික අවස්ථාවන්හි දී නිසි පරිදි ප්‍රතිකාර ලබා නොදුන් සෞඛ්‍යමය ගැටළු කාලයත් සමග බරපතල සහගත තත්ත්වයක් ලෙස වර්ධනය වෙමින් ජීවිතය පවා තර්ජනයට ලක්කරයි.

- **මානසික සෞඛ්‍යය ගැටලු**

  තමන්ගේ පවුලෙන් වෙන් කර තැබීම, මිතුරන්ගෙන් හා සමාජයෙන් හුදකලා කිරීම හේතුවෙන් වන බිය නිසා, වෙළඳාමට ලක්වූ ළමා වින්දිතයෝ මානසික හා භාවාත්මක සංකූලතාවන්ට නිරන්තරයෙන් ම මුහුණ දෙති. මෙයට අමතරව ඔවුන් රැඳවුම්භාරයේ තබා සිටින අවස්ථාවේ දී වෙළඳාම්කරුවන්ගේ මානසික වධ හිංසාවට හා තර්ජනයන්ට ගොදුරු වෙයි.  මෙම අත්දැකීම් කල් පවත්නා මානසික ගැටලූ බවට පරිවර්තනය විය හැකි අතර දරුවාගේ මානසික සෞඛ්‍යමය සහ යහපැවැත්ම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑම් සිදුකරයි.

**වෙළඳාම් කිරීම හේතුවෙන් ඇතිවිය හැකි නිශේධනීය මානසික බලපෑම් පහත ආකාරයට හඳුනාගත හැකිය.**

- දිනපතා සිදුවන මානසික අපයෝජනය හා වධ හිංසහිංසාවට ලක් කිරීම හේතුවෙන් හටගන්නා මානසික කම්පනය මෙය විශාදය, පීඩනය ආශ්‍රිත ආබාධයන්, දිශානති හරණය (මං මුලාව), මානසික වූ ව්‍යාකූලභාවය සහ හදිසියේ මහත් කම්පනයකට පත් වීමේ තත්ත්වයන් ඇති වීම.
- ආත්ම විශ්වාසය නොමැති වීම තුළින් ස්වයං වරදකාරී හැඟීමක්, තමාට ම වෛර කර ගන්නා තත්ත්වයක් ඇතිවීම හෝ ආත්ම අභිමානය දුර්වල වීමෙන් සියදිවි හානි කර ගැනීම හෝ ඒ පිළිබඳ සිතිවිලි පහළ වීම සිදු වීම.
- අසරණභාවය, ලජ්ජාශීලී භාවය, අපකීර්තියට ලක් වීම, කම්පනය, අතීතාවර්ජනය, නරක සිහින පෙනීම, ප්‍රතික්ෂේප කිරීම, අවිශ්වාස කිරීම යන හැඟීම් ඇති වීම.
- තමා වෙනත් රටක සිටින බව දැන ගැනීමෙන් ඇතිවන සංස්කෘතික කම්පනය.

ළමයෙකු ලෙස මෙම විවිධාකාර අත්දැකීම් ඔස්සේ වින්දිතයකු බවට පත් වූ ළමාවිය තුළින් වැඩිහිටි වියේ දී මානසික ආබාධ සහ ගැටළුවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළ නංවයි.

- **සංවර්ධනයට වන බලපෑම**

  දීර්ඝ කාලීනව දරුවන් මානසික, කායික හා ලිංගික අපයෝජනයන්ට ගොදුරුවීම, කුසගින්න සහ මන්දපෝෂණයය, තර්ජනය සහ හුදකලා කිරීම දීර්ඝකාලීන සහ ස්ථිර වර්ධනයට බලපෑම් ආදිය ගැටලුකාරී බලපෑම් ඇති කරයි. තවදුරටත් ළමා කාලය අහිමි කිරීම, ගෞරවය සහ මානසික යහ පැවැත්මට වන බලපෑම් තුළින් ආත්ම විශ්වාසය අවම කරන අතර පෞද්ගලික අරමුණු නිශ්චය කරගැනීම සහ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගීමේ දී දුර්වලතා ඇති කරයි.

  ළමයින් ලෙස තම මූලික අධ්‍යාපනය සම්පූර්ණ කර නොගන්නා වින්දිත දරුවන් සාක්ෂරතාවයෙන් තොර වීම හා පුද්ගලයෙකුට අවශ්‍ය හැකියාවන් වර්ධනය කර ගැනීමට නොහැකි වීම පශ්චාත් ළමා අවධියේ දී නිශේධනීය බලපෑම් ඇති කරයි. මේ හේතුවෙන් ගෞරවනීය ජීවත්වීමේ පරිසරයක් ගොඩනගා ගැනීමට නොහැකිවීම, පවුලට ශක්තියක් වීමට නොහැකිවීම හෝ තම අභිමතාර්ථ ඉටු කරගැනීමට නොහැකිවීම යන ගැටලුවලට මෙම දරුවන් මුහුණ දෙනු ලැබේ.

  දරුවන් කුට්ටනය කිරීම ළමයාගේ ශාරීරික සෞඛ්‍යයට පමණක් බලපාන්නක් නොව එය මානසික සෞඛ්‍යයට බලපෑම් සිදුකරමින් දරුවාගේ සංවර්ධනයට බලපෑම් කරන අතර එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් තහවුරු කරන ලද ළමා අයිතිවාසිකම් ද උල්ලංඝනය කරනු ලබයි.

  - තම ශරීරය පිළිබඳව තීරණ ගැනීමට දරුවාට ඇති අයිතිය
  - කෘරත්වය සහ නිදහස් අදහස් අහිමි කිරීම්වලින් තොර වීමට ඇති අයිතිය
  - විවේකයට ඇති අයිතිය
  - පවුලක් සමඟ ජීවත් වීමේ අයිතිය
  - අධ්‍යාපනයට ඇති අයිතිය
  - පෞද්ගලිකත්වයට ඇති අයිතිය

### *(a) පවුල*

පවුල යන සංකල්පය විවිධ ආකාර යටතේ අර්ථ නිරූපණය කළ හැකි ය. පවුල, සංවිධිත සමාජය තුළ ඉතාම කුඩා ඒකකය වශයෙන් සෑම අවස්ථාවකදීම හඳුනාගනියි. සාම්ප්‍රදායිකව පවුල තුළින් දරුවන් අන්‍යෝන්‍ය ගෞරවය, ආදරයය, කරුණාව, සමාව දීම හා අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අවබෝධයෙන් ලබා ගනියි. පවුල ආරක්ෂාව, මානසික හා භෞතික පුනර්ජීවනය, කොන්දේසි විරහිත ආදරය ලබා දෙයි. ළමයින් වෙළඳාම පහත ආකාරයට පවුල කෙරෙහි බලපෑම් සිදුකරයි.

- ළමයින් වෙළඳාම් කිරීම පවුල කෙරෙහි සුවිශාල පීඩනයක් ඇති කරන අතර සමහර අවස්ථාවල දී පවුල් සංස්ථාව බිඳ වැටීමට ද හේතු වේ. බිය සංකාව, දැඩි ශෝකය සහ පවුලෙහි සාමාන්‍ය ක්‍රියාවලිය කඩාවැටීම දෙවන පරම්පරාවක් වින්දිතයන් බවට පත් කරයි.

- පවුලේ අනෙක් සාමාජිකයන් ද වෙළඳාමට ලක් වීමෙන් භීතියෙන් යුතුව ජීවත් වීම.
- වෙළඳාම් කරන ලද දරුවා යොදා ගෙන කරන ලද අසභ්‍ය ඡායාරූප සහ වීඩියෝ පට මගින් අනෙකුත් අවශ්‍යතා කැපකරමින් පවුලේ සාමාන්‍ය පැවැත්මට සහ අනිකුත් සාමාජිකයන් බලපෑමට ලක්වීම මේ තුළින් සිදු වෙයි. තම ජීවත් වන ප්‍රදේශයෙන් ඉවත් වී නොදන්නා ප්‍රදේශයක හුදකලාව පදිංචි වීමෙන් මෙම කැළල් සඳහා ප්‍රතිචාර දක්වයි.
- වෙළඳාමට ලක් වූ වින්දිතයකු යථා තත්ත්වයට පත්කර ගැනීම පවුලකට දැවැන්ත අභියෝගයක් වන අතර සමගාමී අනෙකුත් අවශ්‍යතා කැප කිරීම හේතුවෙන් පවුලේ සාමාන්‍ය පැවැත්මට සහ අනිකුත් සාමාජිකයන් බලපෑමට ලක්වීම මේ තුළින් සිදු වෙයි.
- ළමයින් වෙළඳාම පිළිබඳ අත්දැකීම් මැඩලීමට උත්සාහ කිරීම තුළ සාංකාව සහ පීඩනයකින් හෙබි වාතාවරණයක් පවුල තුළ උද්ගත වන අතර එය දෙවන පරම්පරාව කෙරෙහි මානසික බලපෑම් සිදුකරයි.

**(b) සමාජයට**

දරුවන් වෙළඳාමට ලක් කිරීමේ නිශේධනීය බලපෑම් දරුවා සහ පවුල් ඉක්මවා ව්‍යාප්ත වන්නේ ය. එය සමස්ත සමාජයටම නිශේධනීය ලෙස බලපායි. පහත දැක්වෙන විශේෂ අවස්ථා යටතේ වෙළඳාම සමාජයට බලපෑම් සිදුකරයි .

- වින්දිතයා, ඔහුගේ/ ඇයගේ පවුල, මිතුරන් සමාජය මගින් නොපිළිගැනීමට ලක්වේ. මෙය වින්දිතයා සමාජයට අන්තර්ග්‍රහණය කරගැනීමේ දී බලපානු ලබයි.
- වෙළඳාමට ලක්වී අනතුරුව ලිංගික සූරාකෑමට හෝ බලහත්කාරයෙන් ගණිකා සේවයට යොදවනු ලැබූ දරුවා ආසාදිතයකු විය හැකි ය.
- එක් ළමයෙකු යම් සමාජයකින් සාර්ථක ලෙස වෙළඳාම් කිරීම යන්න එම සමාජයේ සිටින සියලූම ළමයින්ගේ අවදානම ඉහළ නංවයි. මන්ද ඒ තුළින් එකී සමාජයේ ඇති අවදානමකින් යුතු දරුවන් සොයා ගැනීමට ශක්‍යතාවක් ඇති මූලයක් බවට පත්වී ඇති බව ඉන් ගම්‍ය වේ.
- සාර්ථකව සිදු වන ළමා වෙළඳාම තුළින් ව්‍යාපාරය සාර්ථක වන අතර ඉන් සමස්ත ළමා ප්‍රජාවටම ඉහළ තර්ජනයක් ඇති කරයි.

**(c) රාජ්‍ය**

ළමයින් වෙළඳාම් කිරීමෙන් රාජ්‍යයකට පහත ආකාරයේ නිශේධනීය බලපෑම් සිදුවෙයි.

**රාජ්‍ය ආරක්ෂාව** - දරුවන් වෙළඳාම ඇතුළුව මිනිසුන් වෙළඳාම් කිරීම් තුළින් රාජ්‍යයක නීතියේ ආධිපත්‍ය තර්ජනයට ලක්වෙයි. රාජ්‍ය අභ්‍යන්තර මෙන්ම බාහිර ආරක්ෂාව කෙරෙහිද මෙය බලපෑම් සිදුකරයි.

**රාජ්‍යයට දැරීමට සිදු වන මූල්‍ය පිරිවැය** - නීතිය ක්‍රියාත්මක කිරීමට වැයවන සෘජු පිරිවැය, බේරාගැනීම, පුනරුත්ථාපනය සහ දරුවා නැවත අන්තර්ග්‍රහණය කිරීම, විමර්ශනය, නඩු පැමිණ වීම සහ වෙළඳාම කළවුන් හට දඬුවම් පැමිණවීමට යන පිරිවැය.

**උදාහරණ-** රැඳවුම් බාරයේ තබා ගැනීමට යන නඩත්තු පිරිවැය

**සමාජ ආර්ථිකමය සංවර්ධනයට වන බලපෑම** - ළමයින් වෙළඳාම් කිරීම හේතුවෙන් බරපතළ ලෙස නැවත ප්‍රතිපූරණය කළ නොහැකි ආකාරයෙන් මානව සම්පත් අහිමි කිරීමක් සිදු සිදුකරයි. මෙය මගින් අනාගතයේ රැකියා අවස්ථා අහිමි කිරීම සහ කාර්යක්ෂමතාව පහළ යෑම සිදුවේ. වෙළඳාමට ලක්වූ දරුවන්ට තම හැකියාවන්. ශක්තිය. දැනුම හා අත්දැකීම් දායක කරගනිමින් රටේ සමාජ ආර්ථික වර්ධනයට දායකත්වය දැක්වීමට හැකියාව තිබුණි. එලෙසම ළමයින් වෙළඳාම් කිරීමට එරෙහිව සටන් කිරීම සඳහා අමතර මුදල් සහ මානව සම්පත් වෙන් කිරීමට සිදුවීම, ගැටළු පිටුදකිමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුලනය කිරීමට කටයුතු කිරීමට රාජ්‍යයකට සිදුවේ.

**රාජ්‍යයේ කීර්ති නාමයට වන නිශේධනීය බලපෑම** - ළමයින් වෙළඳාම් කිරීම පිළිබඳව ඉහළ අවදානමක් ඇති රටක්, අන්තර්ජාතික ප්‍රජාව විසින් හෙළා දකිනු ඇත. අන්තර්ජාතික සහ කලාපීය වශයෙන් එකඟ වූ කලාපීය හා ජාත්‍යන්තර බැඳියාවන් ඉටුකිරීමට රාජ්‍යයකට අන්තර්ජාතික ප්‍රජාව වෙත වගකීමක් ඇත. මෙය රාජ්‍යයක් හා අන්තර්ජාතික ප්‍රජාව අතර වන රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා සහ වෙළෙඳ කටයුතු කෙරෙහි බලපෑම් සිදු කරයි.



**ඉගෙනුම් මෙවලම්**

**අභ්‍යාස**

**ක්‍රියාකාරකම 1 - තනි පුද්ගල අභ්‍යාසය**

සහභාගි වන්නන් පහත සඳහන් ප්‍රකාශ **වැරැදි හෝ නිවැරදි** භාවය ලකුණු කර වැරදි ප්‍රකාශය නිවැරදි කර දක්වන්න

| | | |
|---|---|---|
| 01 | ළමයින් වෙළඳාම යන්න තුළ යම් ආකාරයක ගමන් කිරීමක්, ප්‍රවාහනය හෝ රාජ්‍ය ය හරහා හෝ රාජ්‍යයක දේශ දේශසීමාවන සීමාවන් එපිටට සංසරණය වීම අනිවාර්යයෙන් සිදුවිය යුතු ය. | |
| 02 | ළමයින් වෙළඳාම් සිදුකරන්නේ ගණිකා වෘත්තියේ යෙදවීම උදෙසා පමණක් නොව වෙනත් ආකාරයේ ශ්‍රම සූරාකෑම්, පොදුවේ ඉහළ ඉල්ලුමක් පවත්නා හානිකර ක්‍රියා සුළු වේතනයක් හෝ වේතනයක් රහිතව අවම සේවා තත්ත්ව යටතේ ඉටුකරවා ගැනීමයි. | |
| 03 | ළමයින් වෙළඳාම් කිරීමේ අරමුණ වන්නේ ළමයින්ගේ ශ්‍රමය සූරාකෑම තුලින් ලාභ ඉපැයීමයි. | |
| 04 | ළමයින් වෙළඳාම් කිරීම යන්න තුළ භෞතිකව වශයෙන් බලපෑම් කිරීම, අවහිර කිරීම සහ /හෝ ප්‍රචණ්ඩත්වය යෙදවීම් අනිවාර්යෙන් අන්තර්ගත විය යුතු ය. | |
| 05 | වෙළඳාම් කරන්නන් සෑම අවස්ථාවකදී ම නාඳුනන පුද්ගලයන් ය. | |
| 06 | වෙළඳාමට ලක්වීම හේතුවෙන් යම් අපරාධමය වරදක් සිදු කළ දරුවකු අපරාධකරුවකු නොව වින්දිතයෙකු ලෙස හඳුනාගත යුතු අතර යුක්ති පද්ධතිය තුළ නැවත වින්දිතයෙක් වීම වැළැක්විය යුතු ය. | |
| 07 | ළමයින් වෙළඳාම් කිරීම සියළු අවස්ථාවන් හිදී සිදුකරන්නේ අත්දැකීම් සහිත සංවිධානාත්මක අපරාධකරුවන් ය. යහපත් අධ්‍යාපනයක් සහිත මධ්‍යම පාන්තික වැදගත් මිනිසුන් වෙළඳාම් කරන්නන් නොවේ. | |
| 08 | දරුවන් වෙළඳාම් කරන්නන් අත්‍යවශ්‍යයෙන් ම පිරිමි පුද්ගලයන් නොවන අතර වෙළඳාමේ වින්දිතයන් අත්‍යවශ්‍යයෙන් ම ගැහැනු දරුවන් ද නොවේ. | |
| 09 | ලිංගික අපයෝජනයට ලක්වූ වෙළඳාම් ළමා වින්දිතයන් සියලු ම අවස්ථාවල දී අපයෝජනය නිසා ඇතිවන භෞතික ලක්ෂණ මගින් හඳුනාගත හැකි ය. | |

මෙම සිදුවීම් ප්‍රවේශමෙන් කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඉහත සිද්ධි අධ්‍යනය තුළ වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් බැලූ බැල්මට සිද්ධියක් තිබෙන්නේ ද ?

2. එක් එක් අනු සිද්ධියේ වෙළඳාම හා සම්බන්ධ සියලූ ම මූලිකාංග හඳුනා ගන්න.
(ක්‍රියාව, ආකාරය සහ අරමුණ )

3. ඉහත අධ්‍යනයේ පූර්ව, සිදුවීම අතරතුර සහ පශ්චාත් වෙළඳාම් අවස්ථාවන් හිදී සිදු කරන ලද අපරාධ හඳුනා ගන්න.

# හතර වන මොඩියුලය

| මූලධර්ම රාමුව සහ අදාල සෙසු ලේඛන | | |
|---|---|---|
| | **දේශන පැය ගණන** | 4 |
| | **ඇගයීම් ක්‍රමවේදය** | පංති කාමර සාකච්ඡා |
| | **අධ්‍යයන අරමුණු** | මෙම මොඩියුලය අවසානයේ දී සහභාගීවන්නන් හට පහත දෑ හැකි විය යුතු ය:<br>• ළමයකුගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරනු ලබන අන්තර්ජාතික හා කලාපීය මානව හිමිකම් ලේඛන, සාමාන්‍ය මානව හිමිකම් ලේඛන හා ළමයින් වෙළඳාම් කිරීමේ ගැටලුව කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම-සම්බන්ධයෙන් මූලික අවබෝධයක් වර්ධනය කිරීම.<br>• අන්තර් ජාතික හා කලාපීය ලේඛනයන් හී දක්වා ඇති ප්‍රධාන සංකල්පයන් හා නිර්වචනයන් පිළිබඳ දැනුවත් වීම.<br>• රාජ්‍යයන් තුල මෙකී ලේඛනයන් බලාත්මක කිරීම සඳහා යොදාගනු ලබන යාන්ත්‍රණයන් පිළිබඳව සහ එය සහභාගීවන්නාගේ භූමිකාවට සම්බන්ධ වන ආකාරය අවබෝධ කර ගැනීම. |

## a. අන්තර්ජාතික නෛතික රාමුව

**හැඳින්වීම**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් පසු යුගයේ දී, අන්තර් ජාතික මානව හිමිකම් නීති

ක්ෂේත්‍රය අන්තර් ජාතික මානව හිමිකම් ලේඛන ගණනාවකින් පෝෂණය වී තිබේ. මෙකී ලේඛන අතුරින් ළමයින්ව සූරාකෑමට එරෙහිව සටන් කිරීම පිණිස කටයුතු කරන සම්මුතීන් හා ප්‍රකාශනයන් ගණනාවක් වේ.

මෙම මොඩියුලය, පොදුවේ ළමා අයිතිවාසිකම් පිළිගනු ලබන සහ ළමුන් ද ඇතුලුව තැනැත්තන් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් අදාල වන ප්‍රධාන මානව හිමිකම් ලේඛනයන් පිළිබඳ සාකච්ඡා කිරීමට අරමුණු කරනු ලබයි.

### 4.1 ශ්‍රී ලංකාව විසින් ළමුන් වෙළඳාම් කිරීමට අදාල ලේඛන අපරානුමත කිරීමේහි ලා වන තත්වය

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNTOC) සහ තැනැත්තන් විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් වෙළඳාම් කිරීම වැළැක්වීම මර්දනය කිරීම සහ දඩුවම් දීම සඳහා වන පැලමෝර් සංධානය (2000) (මෙය තැනැත්තන් වෙළඳාම් කිරීමේ සංධානය හෝ පැලමෝර් සංධාන ද්විත්වයෙන් එකක් ලෙෂ ද හැඳින්වේ.)

**දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතිය යනුඃ**

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අරමුණ වන්නේ දේශාන්තර සංවිධානාත්මක අපරාධ ඵලදායී ලෙස වළක්වා ගැනීමත් එයට විරුද්ධව සටන් කිරීමත් සඳහා වන සහයෝගීතාවය වර්ධනය කිරීමයි. (1 වන ව්‍යවස්ථාව). එමගින් මූලික වශයෙන් සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලට සහභාගී වීම එවැනි කණ්ඩායම් මගින් මුදල් විශුද්ධිකරණය කිරීම, දූෂණය, අපරාධකරණය කිරීම සහ යුක්තියට බාධා කිරීම අපරාධකරනය කිරීම සමබන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකාව දේශාන්තර සංවිධානාත්මක අපරාධ සම්මුතිය 2000 දෙසැම්බර් 13 වන දින අත්සන් කළ අතර 2006 සැප්තැම්බර් 22 වන දින අපරානුමත කරන ලදී.[31]

**පහත සඳහන් අවස්ථාවන්වල දී අපරාධයක් දේශාන්තර වශයෙන් හඳුන්වනු ලබයි.**

a) එය රාජ්‍යයන් එකකට වඩා වැඩි සංඛ්‍යාවක දී සිදුකර තිබෙන අවස්ථාවක දී;

b) එය එක් රාජ්‍යයක් තුල සිදුකර තිබුන ද එහි ලා සූදානම් වීම, සැලසුම් කිරීම, මෙහෙයවීම හෝ පාලනයේ හරයාත්මක කොටසක් වෙනත් රාජ්‍යයක දී සිදුවී තිබෙන අවස්ථාවක දී;

c) එය එක් රාජ්‍යයක් තුල සිදුකර තිබුන ද එක් රජ්‍යයකට වැඩි රජ්‍යය ගණනාවක අපරාධ ක්‍රියාවන්ගේ නිරත අපරාධ කණ්ඩායමක් සම්බන්ධ වන විට; හෝ

d) එය එක් රාජ්‍යයක් තුල සිදුකර තිබුන ද එහි හරයාත්මක බලපෑමක් වෙනත් රාජ්‍යයකට පවත්නා විට (3.2 ව්‍යවස්ථාව)

**සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක්** යන්න දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි නිර්වචනය කර තිබෙන්නේ ඍජුව හෝ වක්‍රව මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිලාභයක් ලබා ගැනීමේ සඳහා දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි (පැලමෝර් සංධානයෙන්) ස්ථාපනය කර ඇති බරපතල අපරාධ එකක් හෝ වැඩි ගණනක් සිදුකිරීමේ සහකාරීත්වය සහිතව කාලයක් පුරා පවත්නා තැනැත්තන් තිදෙනකු හෝ ඊට වැඩි ගණනක සංවිධානය වූ කණ්ඩායමක් ලෙස ය.

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතිය සංධාන ද්විත්වයකින් ඌණපූරණය කරනු ලැබ ඇති අතර සම්මුතියෙහි 37 වන ව්‍යවස්ථාව ප්‍රකාරව යම් රාජ්‍යයකට සංධානයට පාර්ශවයක් වීම පිණිස මව් සම්මුතියෙහි පාර්ශවකාරීත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වුවද යම් රාජ්‍යයක් සංධානයෙන් බැඳෙන්නේ එම රාජ්‍යය එකී සංධානයේ පාර්ශවකාර රාජ්‍යයක් නම් පමණි. දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි සංධානයන් අර්ථ නිරූපණය කළ යුතු වන්නේ සම්මුතිය ආශ්‍රිතව වන අතර එහි ලා එකී සංධානයෙහි අරමුණ සැලකිල්ලට භාජනය කළ යුතු ය.

## 4.2. පැලමෝර් සංධානය යනුඃ

පැලමෝර් සංධානයේ පූර්විකාව, තැනැත්තන් වෙළඳාම් කිරීම විශේෂයෙන් කාන්තාවන් හා ළමයින් වෙළඳාම් කිරීම වැළැක්වීම සඳහා ආරම්භක රජ්‍යයන්, සංක්‍රාන්තික රාජ්‍යයන් හා ගමනාන්ත රාජ්‍යයන් හීදී තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීමට, තැනැත්තන් වෙළඳාම් කරන්නන්ට දඬුවම් කිරීම හා වින්දිතයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පෘථුල

[31] https://www.unodc.org/documents/middleeastandnorthafrica/organized-crime/UNITED_NATIONS_CONVENTION_AGAINST_TRANSNATIONAL_ORGANIZED_CRIME_AND_THE_PROTOCOLS_THERETO.pdf

අන්තර්ජාතික ප්‍රවේශයක් අවශ්‍ය බව පිළිගනු ලබයි. තැනැත්තන් වෙළඳාම් කිරීමට අදාල සියලු ම පැතිකඩයන් ආමණ්ත්‍රණය කිරීමට අවශ්‍ය විශ්වීය ලේඛනයක නොපැවැත්ම ඒ මඟින් හඳුනාගනු ලබන අතර පැලමෝර් සංධානය මඟින් එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීමට චේතනා කරනු ලබන බව සඳහන් කර තිබේ.

ශ්‍රී ලංකාව 2000 දෙසැම්බර් 13 වන දින පැලමෝර් සංධානය අත්සන් කරනු ලැබූ අතර 2015 ජූනි 15 වන දින එය අපරානුමත කරන ලදී.[32]

පැලමෝර් සංධානයේ අරමුණු වශයෙන් පහත ද හඳුනාගෙන තිබේ:

අ) කාන්තාවන්ට හා ළමයින්ට විශේෂ අවධානය යොමුකමින්, තැනැත්තන් වෙළඳාම වැළැක්වීම හා එයට එරෙහිව සටන් වැදීම

ආ) ඔවුන්ගේ මානව හිමිකම්වලට සම්පූර්ණ ගෞරවය ලබා දෙමින් එවැනි තැනැත්තන් වෙළඳාමට ලක් වූ වින්දිතයන්ට ආරක්ෂාව හා සහය ලබා දීම සහ

ඇ) මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස රාජ්‍ය පාර්ශවයන් අතර සහයෝගීතාවය වර්ධනය කිරීම

(2 වන ව්‍යවස්ථාව).


### 4.2.1 නිර්වචනයන්

| පැලමෝර් සංධානයේ 3 (අ) ව්‍යවස්ථාව අනුව තැනැත්තන් වෙළඳාම් කිරීම පහත පරිදි වේ: | |
|---|---|
| ක්‍රියාව | • තැනැත්තන් බඳවා ගැනීම, ප්‍රවාහනය, මාරු කිරීම, රැකවරණය දීම හෝ භාරගැනීම |
| ක්‍රමවේදය | • තර්ජනය කිරීම හෝ බලහත්කාරයෙන් හෝ වෙනත් ආකාරයේ බලකිරීම්,<br>• පැහැරගෙන යාම,<br>• වංචාව,<br>• රැවටීම,<br>• බලය හෝ අසරණභාවය අයුතු ලෙස භාවිතාව; හෝ<br>වෙනත් පුද්ගලයෙකුගේ පාලනය කිරීමට හැකි පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීමක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබාදීම හෝ ලබා ගැනීම,<br>යන ක්‍රමවේද මඟින් |
| අරමුණ | සූරාකෑමේ අරමුණ ඇතිව. |
| සූරාකෑම | අවම වශයෙන්,<br>• වෙනත් පුද්ගලයින් ගණිකා වෘත්තියේ යොදවා සූරාකෑම හෝ<br>• අන් ආකාරයෙන් ලිංගික සූරාකෑම<br>• බලහත්කාරයෙන් සේවයෙහි හෝ සේවාවන්හි යෙදවීම<br>• වහල් භාවය හෝ වහල් භාවයට සමාන ක්‍රියා<br>• දාසකම, හෝ<br>• අවයව ඉවත් කරගැනීම යනාදිය<br>සූරාකෑම යන්නට පහත ද ඇතුලත් විය යුතු ය. |

[32] Sri Lanka ratified the Palermo Protocol with the reservation "… [T]he Government of the Democratic Socialist Republic of Sri Lanka does not consider itself bound by paragraph 2 of Article 15 as provided for in paragraph 3 of Article 15."




**ඔබ දැන සිටියාද?**




මෙම අවස්ථාවන් හිදී අපරාධ වගකීමෙන් මුක්තවීම පිණිස "කැමැත්ත" යන ව්‍යතිරේඛය අදාල නොවේ. මෙය කිසිවෙකු සූරාකෑමට ලක්වීම පිණිස කැමැත්ත ප්‍රකාශ නොකරන බවට වන මූලධර්මය මත පිහිටා තිබේ. මන්දයත් –

- වැඩිහිටියෙක් සම්බන්ධයෙන් වන අවස්ථාවක කැමැත්ත අයෝග්‍ය ක්‍රම හරහා නිශේධ කර තිබෙන අවස්ථාවන් හිදී; සහ
- දරුවන් සම්බන්ධයෙන් වන අවස්ථාවන් හිදී ඔවුන්ගේ අසරණභාවය ඔවුන්ට කැමැත්ත දීමට ඇති හැකියාව නිශේධ කරනු ලබයි.

## 4.2.2 පැලමෝර් සංධානයේ අදාලතාවය

තැනැත්තන් වෙළදාම් කිරීමේ සංධානය අදාල වන්නේ:

- 5 වන ව්‍යවස්ථාව යටතේ, යම් වරදක් ස්වභාවයෙන් දේශාන්තර වන අතර සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් සම්බන්ධ වන අවස්ථාවන් හිදී, එකී වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම සහ ඒවාට විරුද්ධව නඩු පැවරීමට සහ
- වින්දිතයින් ආරක්ෂා කිරීමට

( 4 වන ව්‍යවස්ථාව )

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ පැලමෝර් සංධානය තැනැත්තන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික යාන්ත්‍රණයක් වර්ධනය කිරීමට අරමුණු කළ ද එමගින් රටක් ඇතුලේ ක්‍රියාත්මක වන එක් එක් තැනැත්තන් වෙළදාම් කරන්නන්ට දඩුවම් කිරීම පිණිස දේශිය නීතින් සම්පාදනය කිරීම වැළැක්වීමක් හෝ සීමා කිරීමක් කරනු නොලබයි.

## 4.2.3. තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්වූ වින්දිතයින් ආරක්ෂා කිරීම

පැලමෝර් සංධානයේ 6 වන ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය පාර්ශවයන් විසින්:

- නෛතික ක්‍රියාමාර්ග වැනි ද සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කරමින්, වින්දිතයන්ගේ පෞද්ගලිකත්වය හා අනන්‍යතාවය ආරක්ෂා කිරීම;
- අධිකරණමය හා පරිපාලනමය ක්‍රියාමාර්ගයන් පිළිබඳව (නෛතික නියෝජනය ද ඇතුලුව) වින්දිතයන්ට තොරතුරු සහ සහය සැපයීම;
- වින්දිතයන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ දරුවන්ගේ විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් රාජ්‍ය නොවන සංවිධානයන් සහ සිවිල් සමාජය සමග සහයෝගයෙන් පහත දැක්වෙන දෑ සපයා දීම හරහා ඔවුනට භෞතික, මානසික හා සමාජීය වශයෙන් යථාපැවැත්මට අවශ්‍ය දෑ සැපයීම:
  - සුදුසු නිවාස
  - උපදේශනය, නෛතික, වෛද්‍ය, මානසික සහ භෞතික උපකාර;
  - රැකියා, අධ්‍යාපන, සහ පුහුණු අවස්ථාවන් ලබා දීම;
- වින්දිතයන්ට භෞතික ආරක්ෂාව සපයා දීම; සහ
- ඔවුන් සිදුවූ හානියට වන්දි ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.

## 4.3. ළමා අයිතිවාසිකම් සහ ළමුන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෙසු අන්තර්ජාතික ලේඛන

### 4.3.1 වගුව

| ලේඛනය | අපරානුමත කළ දිනය |
|---|---|
| එ.ජා. වහල්භාවය පිළිබඳ සම්මුතිය, 1926 | 21 March 1958 |
| C029 අන්තර් ජාතික කම්කරු සංවිධනයෙහි බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳ සම්මුතිය, 1930 | 5 April 1950 |
| එ. ජා. තැනැත්තන් වෙළදාම් කිරීම සහ අන් අය ලිංගිකව සූරාකෑම මර්ධනය කිරීම පිළිබඳ සම්මුතිය, 1949 | 15 March 1958 |
| වහල්භාවය, වහල් වෙළදාම සහ ආයතනයන් සහ වහල්භාවයට සමාන පරිචයන් තුරන් කිරීම පිළිබඳ එ.ජා සම්මුතිය, 1956 | 20 March 1958 |
| සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය, 1966 | 11 June 1980 |
| C143 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අපයෝජිත තත්ත්වයන් යටතේ සංක්‍රමනය හා සංක්‍රමණික සේවකයන්ට සමාන අවස්ථාවන් හා සැලකීම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන සම්මුතිය, 1975 | Not ratified |
| කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ එ.ජා. සම්මුතිය, 1979 | 5 October 1981 |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ එ.ජා. සම්මුතිය, 1989 | 12 July 1991 |
| ළමයින්ගේ ආරක්ෂාව සහ අන්තර් රාජ්‍ය දරුකමට හදාගැනිම සම්බන්ධ සහයෝගිතාව පිළිබඳ සම්මුතිය (‘දරුකමට හදා ගැනීම පිළිබඳ හේග් සම්මුතිය’; 1993) | 23 January 1995 |
| සියලු ම සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එ. ජා සම්මුතිය, 1991 | 11 March 1996 |
| C138 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ රැකියාවන්ට බඳවා ගැනීම පිළිබඳ වන අවම වයස පිළිබඳ සම්මුතිය, 1973 | 11 February 2000 |
| සන්නද්ධ අරගලයන්වල දී ළමයින් යොදා ගැනීම සම්බන්ධ, ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පිත සංධානය, 2000 | 2000 |
| C182 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වන සම්මුතිය, 1999 | 1 March 2001 |
| කාන්තාවන් සහ ළමයින් වෛශ්‍ය වෘත්තියේ යෙදවීම, වැළැක්වීමට සහ ඊට එරෙහිව සටන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ සම්මුතිය, 2002 | January 2002 |
| ළමා සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන කලාපීය විධිවිධාන පිළිබඳ සාර්ක් සම්මුතිය, 2002 | January 2002 |
| C105 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම අහෝසි කිරීම සඳහා වන සම්මුතිය, 1957 | 7 January 2003 |
| ළමයින් විකිණීම, ළමා වෛශ්‍ය වෘත්තිය සහ ළමා අසභ්‍ය දර්ශනයන් පිළිබද ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පිත සංධානය, 2000 | 2006 |
| එ.ජා. දේශාන්තර සංවිධානාත්මක අපරාධ සම්මුතිය ඌණපූරනය කිරීම පිණිස වූ තැනැත්තන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමයින්, වෙළදාම් කිරීම වැළැක්වීම මර්දනය කිරීම සහ දඩුවම් දීම සඳහා වන සංධානය , 2000 (පැලමෝර් සංධානය) | 15 June 2015 |
| බැංකොක් ගිවිසුම සහ කාර්ය සැලැස්ම, 1998 | Ratification not required |

## 4.4 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මානව හිමිකම් ඉතිහාසයේ සංධිස්ථානයක් වන අතර එය සියලු ම පුද්ගලයන් සහ රාජ්‍යයන් සඳහා අත්පත් කරගත යුතු පොදු ප්‍රමිතීන් වශයෙන් 1948 දෙසැම්බර් 10 වන දින පැරිස් හිදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් (මහා මණ්ඩල යෝජනා සම්මත 217 A) ප්‍රකාශයට පත් කරන ලදී. පළමු වරට ඒ මඟින් විශ්වීයව ආරක්ෂා කළ යුතු මූලික මානව හිමිකම් සඳහන් කරන අතර එය භාෂා 500 වඩා පරිවර්තනය වී තිබේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 4 සහ 5 ව්‍යවස්ථාවන් ළමුන් විකිණීම සම්බන්ධයෙන් වඩාත් අදාල වේ.

**4 ව්‍යවස්ථාව** - කිසිම අයෙකු වහල්භාවයේ හෝ පරවශතාවයේ නොයෙදවිය යුතු යඃ සියලු ම ආකාරයේ වහල්භාවය සහ වහල් වෙළඳාම තහනම් කළ යුතු ය.

**5 ව්‍යවස්ථාව** - කිසිදු පුද්ගලයකු වදහිංසාවට හෝ කෲර අමානුෂීය හෝ අවමන් සහගත සැලකීමට හෝ දඬුවමට යටත් නොකළ යුතු ය.

## 4.5 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (1979) (CEDAW)

**සීඩෝ යනු**

තැනැත්තන් වෙළඳාම් කිරීම නතුවීම සඳහා කාන්තාවන් සහ ළමුන් විශේෂයෙන් අසරණභාවය පත්වන අපරාධයක් බවට සලකනු ලැබේ.[33] කාන්තා අයිතිවාසිකම් සඳහා වන විශේෂ ලේඛනයක් යන අදහස පළමුවරට 1975 වර්ෂයේ දී මෙක්සිකෝවේ දී පැවැත්වූ පළමු කාන්තා සමුළුවේ දී පැන නගින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 1979 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 34/180 වන යෝජනා සම්මතය යටතේ දී පිළිගනු ලැබූ අතර එය අත්සන් කිරීම අපරානුමත කිරීම සහ ඈදා ගැනීම පිණිස විවෘත කරන ලදී. එය කාන්තාවන් සඳහා වූ අන්තර්ජාතික අයිතිවාසිකම් පනත වශයෙන් හඳුන්වනු ලැබීය. එය 1981 සැප්තැම්බර් 3 වන දින 27(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලාත්මකභාවයට පැමිණියේ ය. 2017 අගෝස්තු වන විට එම සම්මුතිය රටවල් 99 ක් අත්සන් කර ඇති අතර 189 ක් අපරානුමත කර තිබේ.[34]

ශ්‍රී ලංකාව මෙම සම්මුතිය 1980 ජුලි 17 වන දින අත්සන් කළ අතර 1981 ඔක්තෝබර් 5 වන දින එය අපරානුමත කරමින් එකී සම්මුතියට රාජ්‍ය පාර්ශවයක් බවට පත්විය. තැනැත්තන් වෙළඳාම් කිරීමට අදාල වන්නේ මෙම සම්මුතියේ 6 වන ව්‍යවස්ථාව වන අතර එහි සඳහන් කරන්නේ "සියලු ම ආකාරයෙන් කාන්තාවන් වෙළඳාම් කිරීමට ලක් කිරීම සහ ගණිකා වෘත්තියේ යොදවා සූරාකෑම මර්දනය කිරීම පිණිස, රාජ්‍යයන් විසින් ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග ද ඇතුලුව සියලු ම සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය".

[33] See Article 9(4) of The Palermo Protocol to Prevent, Suppress and Punish Trafficking in Persons, especially Women and Children (2000)

[34] https://treaties.un.org/Pages/ViewDetails.aspx?src=TREATY&mtdsg_no=IV-8&chapter=4&lang=en

### 4.5.1 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාල වෛකල්පිත සංධානය

කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාල වෛකල්පිත සංධානය 1999 ඔක්තෝබර් 6 වන දින පිළිගත් අතර එය 2000 දෙසැම්බර් 22 වන දින බලාත්මකභාවයට පත්විය.[35] කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයන් නිරායාසයෙන් ම මෙම වෛකල්පිත සංධානයට රාජ්‍ය පාර්ශවයන් බවට පත් නොවේ. එකී වෛකල්පිත සංධානයට පාර්ශවයක් වීමට නම් අදාල රාජ්‍යයන් එයට අත්සන්කොට අපරානුමත කළ යුතු ය.

ශ්‍රී ලංකාව 2002 ඔක්තෝබර් 15 වන දින ඇදාගැනීම මගින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාල වෛකල්පිත සංධානයට පාර්ශවකාර රාජ්‍යයක් බවට පත්විය.

මෙම වෛකල්පිත සංධානය තුල ප්‍රධාන කාර්ය පටිපාටීන් දෙකක් සඳහන් කර තිබේ;

- කමිටුවට අදාල සම්මුතිය යටතේ ආරක්ෂා කර තිබෙන අයිතිවාසිකම් උල්ලංඝණය වූ බවට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා තනි කාන්තාවකට හෝ කාන්තා කණ්ඩායමකට අවසර දෙන සන්නිවේදන ක්‍රියාපටිපාටිය.
- බරපතල සහ ක්‍රමානුකූලව කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ තත්ත්වයන් පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම සඳහා හැකි කරවන විමර්ශන ක්‍රියාපටිපාටියක්.


ඉහත කවර අවස්ථාව යටතේ දී වුවද රාජ්‍යය කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට සහ එහි වෛකල්පිත සංධානයට පාර්ශවකාර රාජ්‍යයක් විය යුතු ය.

### 4.5.2 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුව (සීඩෝ කමිටුව)

කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුව (සීඩෝ කමිටුව) කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාවට නැංවීම නිරීක්ෂනය කරනු ලබයි. සීඩෝ කමිටුව එම සම්මුතියේ විෂය පථය පිළිබඳව ඉහළ ශක්‍යතාවයක් සහිත විශේෂඥයින් 23 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම විශේෂඥයින් වසර දෙකක නිල කාලයක් සඳහා තෝරා පත්කර ගනු ලබන අතර රාජ්‍ය පාර්ශවයන් විසින් නාමකරණය කරනු ලබයි.

සීඩෝ කමිටුව යනු බලාත්මක කරන ආයතනයක් නොවේ. එම කමිටුවට රාජ්‍යන්ට සම්මුතියට අනුගතවීමට බලකල නොහැකි අතර එලෙස අනුගත වීමට අපොහොසත් වීම හේතුවෙන් දඬුවම් දීමට හෝ හැකියාවක් නොමැත. කෙසේ වුවද එය රාජ්‍ය පාර්ශවයන් සමඟ සම්මුතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීම පිණිස සහයෝගයෙන් කටයුතු කරයි.

### 4.5.3 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියෙහි වාර්තා කිරීමේ ක්‍රියාවලිය




කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියෙහි පාර්ශවකාර රාජ්‍යයන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අනුව වෙනස්කොට සැලකීමට ලක්කරන ආකාරයේ නීතීන් ප්‍රතිපත්තීන් සහ පරිචයන් ප්‍රතිසංස්කරණය කිරීම ද ඇතුලුව කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීමට භාරගනු ලබයි. කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුව විසින් කලින් කලට කාලාන්තර වාර්තා කිරීමේ ක්‍රියාවලියක් තුලින් පාර්ශවකාර රාජ්‍යයන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ගයන් සුපරීක්ෂා කරනු ලබයි.

ඒ අනුව සම්මුතියෙහි පාර්ශවකාර රාජ්‍යයන් විසින් සම්මුතිය අපාරනුමත කිරීමෙන් අනතුරුව වසරක් ඇතුලත සහ ඉන් අනතුරුව සෑම වසර හතරකට ම වරක් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ

[35] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPCEDAW.aspx

කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට අපේක්ෂා කරනු ලබයි. මෙම වාර්තාව තුල පාර්ශවකාර රාජ්‍යයන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා ලද ප්‍රගතිය සහ ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විස්තරය කළ යුතු ය. පාර්ශවකාර රාජ්‍යය විසින් ඉදිරිපත් කරනු ලබන නිල වාර්තාව හැරුණකොට ඡායා වාර්තාවක් මාර්ගයෙන්, රාජ්‍ය පාර්ශවයක් විසින් භාරගනු ලැබූ වගකීම් ක්‍රියාවට නැංවීම පිළිබඳ ඔවුන්ගේ මතය ඉදිරිපත් කිරීමට රාජ්‍ය නොවන සංවිධානයන්ට අවසර ලබා දී ඇත.

## 4.6 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989) සහ එහි සංධානයන්

### 4.6.1 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යනු

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ළමා අයිතිවාසිකම් සම්මුතිය) ළමයින්ගේ සිවිල්, දේශපාලනික, ආර්ථික, සාමාජීය, සෞඛ්‍ය සහ සංස්කෘතිකමය අයිතිවාසිකම් සඳහන් කරනු ලබන මානව හිමිකම් සම්මුතියකි. මෙම සම්මුතිය 1989 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 44/25 දරන යෝජනා සම්මතය යටතේ පිළිගත් අතර එය අත්සන් කිරීම අපරානුමත කිරීම සහ ඇදාගැනීම පිණිස විවෘතව **ත**බන ලදී.[36] එය 1990 සැප්තැම්බර් 2 වන දින එහි 49 වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලාත්මකභාවයට පැමිණෙන ලදී. එය රාජ්‍යයන් අතර අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමට ලක්වූ ගිවිසුමකි. මෙම සම්මුතිය අපරානුමත කරන ලද එක් එක් රාජ්‍යයන් ස්වකීය රට තුළ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමේ වගකීමට යටත් වේ. 2017 අගෝස්තු වන විට රටවල් 140ක් මෙම සම්මුතිය අත්සන් කර තිබෙන අතර රටවල් 194ක් එය අපරානුමත කර තිබේ.[37]

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් සම්මුතිය 1990 ජනවාරි 26 වන දින අත්සන් තබනු ලැබූ අතර 1991 ජූලි 12 වන දින අපරානුමත කරන ලදී.

ළමා අයිතිවාසිකම් සම්මුතිය ව්‍යවස්ථා 54කින් සමන්විත වේ. මෙම සම්මුතිය හරහා ළමයකු සතු අයිතිවාසිකම් සහ එම අයිතිවාසිකම් සුරැකීමේ හි ලා වැඩිහිටියෙකු සතු වගකීම් දක්වා තිබේ. මෙම අයිතිවාසිකම් කාණ්ඩ හතරකට බෙදා දැක්විය හැකි ය.

- ***ආරක්ෂණ අයිතිවාසිකම්*** - ආරක්ෂණ අයිතිවාසිකම් මගින් සියලු ම ආකාරයේ අපයෝජනයන් නොසලකාහැරීම් සූරාකෑම් සහ කෲරත්වයන්වලට එරෙහිව ළමයාගේ ආරක්ෂාව තහවුරු කරනු ලබයි.

- ***පැවැත්ම සඳහා වන අයිතීන් සහ සංවර්ධනය සඳහා වන අයිතීන්*** - මෙම කාණ්ඩ දෙක යටතේ ළමයකුගේ පැවැත්ම සහ පූර්ණ සංවර්ධනය සඳහා අවශ්‍ය වන සම්පත් කුසලතා සහ දායකත්වයන් සඳහා වන අයිතීන් තහවුරු කරනු ලබයි. ප්‍රමාණවත් ආහාර, ආරක්ෂාව, පිරිසිදු ජලය, විධිමත් අධ්‍යාපනය, මූලික සෞඛ්‍ය පහසුකම්, නිවාඩු හා විනෝදාංශ, සංස්කෘතිකමය ක්‍රියාකාරකම් සහ තොරතුරු සඳහා වන අයිතිවාසිකම් මෙම කාණ්ඩ දෙක යටතට පැමිණේ.

- ***සහභාගීත්ව අයිතිවාසිකම්*** - ළමයින්ට ඔවුන්ගේ සාමාජීය, ආර්ථික, ආගමික, සංස්කෘතික සහ දේශපාලන අයිතිවාසිකම්වලට බලපෑම් කරන කාරණයන් සම්බන්ධයෙන් ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. අදහස් ප්‍රකාශ කිරීමට සහ ඇහුම්කනු දෙනු ලැබීමට ඇති අයිතිය, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය හා සාංගමික අයිතිවාසිකම යන අයිතීන් මෙම කාණ්ඩයට අයත් වේ. මෙම අයිතිවාසිකම් සමාජය තුල ස්වකීය අයිතිවාසිකම් යතාර්ථවත් කර ගැනීමට සහ භුක්ති විඳීම සඳහා ළමයින්ට උපකාරී වේ.

[36] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CRC.aspx

[37] https://treaties.un.org/Pages/ViewDetails.aspx?src=IND&mtdsg_no=IV-11&chapter=4&lang=en

- ***ළමයාගේ උපරිම යහපත***

  ළමා අයිතිවාසිකම් සම්මුතිය හරහා ළමයින්ට සම්බන්ධ මූලධර්මයක් වන ළමයාගේ උපරිම යහපත නැමැති ඉතා වැදගත් මූලධර්මය පිළිගනු ලබයි. ළමයින්ට බලපෑ හැකි ඕනෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ළමයාගේ උපරිම යහපත යන මූලධර්මය ප්‍රාථමික වශයෙන් සලකා බැලිය යුත්තකි. ඒ අනුව වැඩිහිටියන් ඔවුන්ගේ පොදු හෝ පෞද්ගලික මට්ටමෙන් තීරණ ගැනීමේ දී සහ ළමුන් සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන ක්ෂේත්‍රයන් වන ව්‍යවස්ථාදායක, අධිකරණ, මූල්‍යමය හෝ පරිපාලනමය වැනි ක්ෂේත්‍රයන් හී තීරණ ගැනීමේ දී මෙම මූලධර්මය අදාළ කර ගත යුතු ය.

**උදාහරණ වශයෙන් :**

- මහජන නිළධාරීන් වශයෙන් රෙගුලාසි පරිවයන් හෝ අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම හරහා වැඩිහිටියන් පරිපාලන තීරණ ගැනීමේ දී;
- නීති සහ ප්‍රතිපත්ති සකස් කිරීම හරහා නීති සම්පාදකයන්;
- නඩු තීන්දු ලබාදීමේ දී විනිසුරුවන් සහ ළමයන්ගේ ජීවිතයේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් දෙමාපියන් තීරණ ගැනීමේ දී ඒවා ඔවුනට සෘජුව බලපෑම් කළ ද නොකළ ද, තීරණ ගනු ලබන පුද්ගලයින් ළමයාගේ උපරිම යහපත යන්න ප්‍රමුඛතාවය සහිතව සලකා බැලිය යුතු ය.

### 4.6.2 ළමා අයිතිවාසිකම් සම්මුතියට අදාල වෛකල්පිත සංධානයන්



**ළමා අයිතිවාසිකම් සම්මුතියට වෛකල්පිත සංධානයන් ත්‍රිත්වයක් ඇත.**

***1. ළමයින්ව සන්නද්ධ අරගලයන්ට සහභාගී කර ගැනීම සම්බන්ධ වෛකල්පිත සංධානය (2002)* (OPAC)**

මෙම වෛකල්පිත සංධානය මඟින් රටේ සන්නද්ධ බලකායන් සඳහා අවුරුදු දහඅටට අඩු ළමුන් බඳවා නොගත යුතු බව තහවුරු කරනු ලබයි. මෙය 2002 ජූලි 12 වන දින බලාත්මකභාවයට පැමිණවෙන ලදී. එය වර්ෂ 2000 දී ශ්‍රී ලංකාව විසින් අත්සන් කර අපරානුමත කරන ලදී.[38]

***2. ළමයින් විකිණීම, ළමා වෛශ්‍ය වෘත්තිය හා ළමා අසභ්‍ය දර්ශන පිළිබඳ වෛකල්පිත සංධානය (2002)* (OPSC)**

මෙම සංධානය මගින් ළමයින් විකිණීම, ළමා වෛශ්‍යා වෘත්තිය හා ළමා අසභ්‍ය දර්ශන යනාදිය තහනම් කරන ලෙස පාර්ශවකාර රාජ්‍යන්ගෙන් ඉල්ලා සිටියි. මෙය 2001 ජනවාරි 18 වන දින දී බලාත්මකභාවයට පැමිණින. ශ්‍රී ලංකාව මෙම සංධානය 2002 දී අත්සන් කළ අතර 2006 දී අපරානුමත කරන ලදී.[39]

***3. සන්නිවේදන ක්‍රියා පටිපාටිය පිළිබඳ වෛකල්පිත සංධානය (2014)* (OPIC)**

මෙම වෛකල්පිත සංධානය ළමා අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් තනි පුද්ගලයන් වශයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට ළමුන්ට හා ඔවුන්ගේ නියෝජිතයන්ට අවකාශය ලබා දී ඇත. මෙම සංධානය 2014 අප්‍රේල් 14 ව දින බලාත්මකභාවයට පත්විය. ශ්‍රී ලංකාව මෙම සංධානයට අත්සන් තබා හෝ අපරානුමත කර නොමැත.[40]

### 4.6.3 ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව

ළමා අයිතිවාසිකම් කමිටුව රාජ්‍ය පාර්ශවයන් විසින් ළමා අයිතිවාසිකම් සම්මුතිය ක්‍රියාත්මක කිරිම පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා වන විශේෂඥයින් 18 දෙනෙකුගෙන් සමන්විත ආයතනයකි. මෙම කමිටුව ළමයින්ව සන්නද්ධ අරගලයන්ට සහභාගී කර ගැනීම සම්බන්ධ වෛකල්පිත සංධානය සහ ළමයින් විකිණීම, ළමා වෛශ්‍ය වෘත්තිය හා ළමා අසභ්‍ය දර්ශන පිළිබඳ වෛකල්පිත සංධානය යන සංධානයන් ද්විත්වය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද නිරීක්ෂණය කරනු ලබයි.

[38] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPACCRC.aspx
[39] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPSCCRC.aspx
[40] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPICCRC.aspx

### 4.6.4 ළමා අයිතිවාසිකම් සම්මුතිය යටතේ වන වාර්තාකරණ ක්‍රියාපටිපාටිය

සියලු ම රාජ්‍ය පාර්ශවයන් විසින් අයිතිවාසිකම් ක්‍රියාවට නැංවූ ආකාරය පිළිබඳව ළමා අයිතිවාසිකම් කමිටුවට වාර්තා කිරීමට වගකීමට බැඳී සිටිති. රාජ්‍ය පාර්ශවයන් විසින් ළමා අයිතිවාසිකම් සම්මුතියට පාර්ශවකාර රාජ්‍යයක් බවට පත්වී වසර දෙකක් ඇතුලත මුල් වාර්තාවක් සහ ඉන් අනතුරුව සෑම වසර පහකට වරක් ම කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ළමා අයිතිවාසිකම් කමිටුව මේ එක් එක් වාර්තාවන් සලකා බලා, "අවසානාත්මක නිරීක්ෂණයන්" වශයෙන් එහි ගැටලු ආමන්ත්‍රණය කරමින් පාර්ශවකාර රාජ්‍යයන් වෙත නිර්දේශයන් නිකුත් කරනු ලබයි.

සන්නිවේදන ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් වන වෛකල්පිත සංධානයට පාර්ශවකාර රාජ්‍යයන් විසින් ළමා අයිතිවාසිකම් සම්මුතියේ සහ එහි වෛකල්පිත සංධානයන් දෙකෙහි පිළිගත් අයිතිවාසිකම් උල්ලංඝණය කළ බවට චෝදනා කරමින් ඉදිරිපත් වී තිබෙන පැමිණිලි සලකා බැලීමට ද කමිටුවට හැකියාව පවතින අතර එම සම්මුතිය සහ වෛකල්පිත සංධානයන් දෙක යටතේ වන ක්‍රමික සහ බරපතල අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට ද හැකියාව තිබේ.

මෙම වාර්තාවන් සලකා බැලීමෙන් අනතුරුව කමිටුව විසින් සම්මුතිය ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය ඇගයීමට ලක් කරමින් සහ අනුමිතීන් හා නිර්දේශයන් සඳහන් කරමින් ඔවුන්ගේ වාර්තාවක් ඉදිරිපත් කරනු ලබයි.

### 4.7 තැනැත්තන් වෙළදාම් කිරීම සහ වෙනත් අය වෛශ්‍ය වෘත්තියෙහි යොදවා සූරාකෑම වැළැක්වීම මර්දනය කිරීම සඳහා වන එ.ජා සම්මුතිය (1949)

**තැනැත්තන් වෙළදාම් කිරීම සම්බන්ධ පළමු අන්තර්ජාතික මැදිහත්වීම එම ගැටලුව දුටුවේ අත්‍යාවශ්‍යයෙන්ම ලිංගික සූරාකෑම පිණිස හෝ වහල්භාවයේ යෙදවීම පිණිස කාන්තාවන් පැහැරගෙන යෑම සහ අපහරණය කිරීමක් ලෙස බැවින් වින්දිතයාගේ මව් රටින් පිටත සිදුකරන ලද සූරාකෑමේ අවස්ථාවන් පිළිබඳව පමණක් අවධානය යොමු කරන ලදී.**

**1949 සම්මුතිය බලහත්කාරයෙන් වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ ඇතැම් පැතිකඩයන් ආවරණය කරන ලද, පෙර පැවති සම්මුතීන් ගණනාවක් අභිබවා යන ලදී.[41] 1949 සම්මුතිය යටතේ පාර්ශවකාර රාජ්‍යයන් වෙත ප්‍රධාන වගකීම් තුනක් පවරනු ලබයි.:**




- **තැනැත්තන් වෙළදාම් කිරීම තහනම් කිරීම;**
- **විශේෂිත පරිපාලනමය සහ බලාත්මක කිරීමේ පියවරයන් ගැනීම; සහ**
- **තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්වූ පුද්ගලයන් අරමුණු කර ගත් සාමාජීය ක්‍රියාමාර්ග.**

**1958 දී ශ්‍රී ලංකාව මෙම සම්මුතියට පාර්ශවකාර රාජ්‍යයක් බවට පත්විය.[42]**

**1949 සම්මුතිය තැනැත්තන් වෙළදාම් කිරීම සම්බන්ධ ගැටලුව ආශ්‍රිත ප්‍රධාන වෙනස්කම් දෙකක් හඳුන්වා දෙන අතර ඒ තුල වෛශ්‍යාව කුට්ටනකරුගේ වින්දිතයකු ලෙස දක්වන අතර පූර්ව සම්මුතීන්වල භාවිතා කළ "සුදු වහල් වෙළදාම" සහ "කාන්තාවන්" යන වචන වෙනුවට ඒ තුළ වාර්ගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොහැගවෙන නිශ්ක්‍රීය වචන වින්දිතයන් හැඳින්වීමට භාවිතා කරනු ලබයි.**

[41] International Agreement of 1904 for the Suppression of White Slave Traffic; International Convention of 1910 for the Suppression of White Slave Traffic; International Convention of 1921 for the Suppression of the Traffic in Women and Children; and International Convention of 1933 for the Suppression of the Traffic in Women of Full Age

[42] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/TrafficInPersons.aspx

1949 සම්මුතිය වෛශ්‍යා වෘත්තිය දෙස ප්‍රථමවරට තැනැත්තන් වෙළඳාම් කිරීමේ පැතිකඩකින් බැලුව ද අවාසනාවකට මෙන් ඒ තුල **<u>වින්දිතයන් යන නිර්වචනය තුළට ළමයින් ඇතුළත් නොකරන</u>** ලදී. එම සම්මුතියේ වූ අනෙක් දුර්වලතාවය වන්නේ එය වර්ධනය කර සාකච්ඡාවට බඳුන් කර තිබෙන්නේ පහත දක්වෙන් ද වටාය:

- තැනැත්තන් වෙළඳාම් කිරීමේ නිර්වචනය හුදෙක් වෛශ්‍ය වෘත්තියේ යොදවා සූරාකෑමට පමණක් සම කර ඇති බැවින් එය වඩා පටු වේ;
- ස්වේච්ඡාවෙන් ගණිකා වෘත්තියේ යෙදීම පිළිබඳ එහි අදාලතාවය, එය රටවල් ගණනාවක නීත්‍යානුකූල වේ; සහ
- 1949 සම්මුතියේ අවධානය වින්දිතයින් ආරක්ෂා කිරීමට වඩා වෛශ්‍ය වෘත්තිය වටා ඇති ක්‍රියාවන් අපරාධකරණයට ලක්කිරීමට යොමුව ඇති අතර 1949 සම්මුතිය තැනැත්තන් වෙළඳාම් කිරීමට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් නිශ්ඵලදායී බවට පත් කළ නිරීක්ෂණය කිරීමේ හා බලගැන්වීමේ යාන්ත්‍රණයන් හී මදකම.

### 4.7.1. තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීමට සහ ඊට එරෙහිව සටන් කිරීමට රාජ්‍ය පාර්ශවයන් කෙරෙහි වන වගකීම

9 වන ව්‍යවස්ථාව හරහා රාජ්‍ය පාර්ශවයන් වෙතින් පුළුල් ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ සෙසු ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂා කරනු ලබයි:

- තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීමට සහ එයට එරෙහිව සටන් වැදීමට; සහ
- තැනැත්තන් වෙළදාම් කිරීමට ලක් වූ වින්දිතයින්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්, නැවත වින්දිතයින් බවට පත්වීමෙන් ආරක්ෂා කිරීම;
- තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම පිණිස පර්යේෂණ, තොරතුරු සහ ජන මාධ්‍ය ව්‍යාපාර සහ සමාජීය හා ආර්ථික වැඩපිළිවෙලවල් වැනි පියවරයන් ගැනීම;
- පුද්ගලයන්ව, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ව තැනැත්තන් වෙළදාම් කිරීමේ ගොදුරු බවට පත් කිරීමට හේතු වන **දරිද්‍රතාවය, අසංවර්ධිතභාවය සහ සමාන අවස්ථාවන් හී අප්‍රමාණවත්භාවය** වැනි සාධකයන් අඩුකිරීමට පියවර ගැනීම;
- තැනැත්තන් වෙළදාම් කිරීම, විශේෂයෙන් ළමයින් සහ කාන්තාවන් සියලු ම ආකාරයේ සූරාකෑමට ලක්කරන සහ තැනැත්තන් වෙළදාම් කිරිමට ලක්කරන සාධකයන් අධෛර්‍යයට පත්කිරීම පිණිස අධ්‍යාපනික, සාමාජීය හෝ සංස්කෘතිකමය පියවරයන් වැනි ව්‍යවස්ථාදායකමය හෝ සෙසු පියවරයන් ශක්තිමත් කිරීම කටයුතු කිරීම.

## 4.8 බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට අදාල අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සම්මුතීන්

| **4.8.1** 1956 වහල්භාවය වහල් වෙළදාම සහ ආයතනයන් මෙන්ම ඒ හා සමාන පරිචයන් අහෝසි කිරීම සම්බන්ධයෙන් වන ඌණපූරණ සම්මුතිය | | **4.8.2** 1999 ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය පිළිබද අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුතිය (No.182) (අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක182) |
|---|---|---|

1956 වහල්භාවය වහල් වෙළදාම සහ ආයතනයන් මෙන්ම ඒ හා සමාන පරිචයන් අහෝසි කිරීම සම්බන්ධයෙන් වන ඌණපූරණ සම්මුතිය පළමු වරට ළමයින් සූරාකෑම පිදිබඳ අවධානය යොමු කරන ලදී. (ඌණපූරණ වහල් සම්මුතිය).[43]මෙම සම්මුතියේ 1(ඈ) ව්‍යවස්ථාව වහල්භාවය යන්න නිර්වචනය කරනු ලබන්නේ "අවුරුදු 18 ට අඩු ළමයකු හෝ තරුණ තැනැත්තකු, ඔහුගේ ස්වභාවික දෙමාපියන් දෙදෙනා ම හෝ ඉන් එක් අයකු හෝ භාරකරු විසින් වෙනත් පුද්ගලයකුට, යම් ප්‍රතිලාභයක් සහිතව හෝ රහිතව, එම ළමයාව හෝ තරුණ තැනැත්තාව හෝ ඔහුගේ ශ්‍රමය සූරාකෑම පිණිස පවරා දෙනු ලබන යම් ආයතනයක් හෝ පරිචයක්" වශයෙනි. මෙකී ඌණපූරණ වහල් සම්මුතිය හරහා ණය බැඳුම්කර සහ බලහත්කාරයෙන් සිදුකරනු ලබන විවාහයන් වහල්භාවය ස්ථාපනය කරන බවට හඳුනාගනු ලබයි.

ශ්‍රී ලංකාව ඌණපූරණ වහල් සම්මුතිය 1957 ජුනි 5 වන දින අත්සන් කළ අතර 1958 මාර්තු 21 වන දින අපරානුමත කරන ලදී.

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 182 මගින් විකිණීමට ලක් වූ ළමුන් මුහුණපාන විවිධ ආකාරයේ ශ්‍රම සූරාකෑම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාව මෙම අංක 182 සම්මුතිය 2011 මාර්තු මාසයේ දී අපරානුමත කරන ලදී.[44]

අංක 182 සම්මුතියෙහි 3 වන ව්‍යවස්ථාව ඉතා නරක ආකාරයේ ශ්‍රමය යන්න පහත පරිදි නිර්වචනය කරනු ලබයි.

(ආ) ළමයකුව වෛශ්‍ය වෘත්තිය සඳහා හෝ අසභ්‍ය දර්ශනයන් සඳහා හෝ අසභ්‍ය චිත්‍රපටි වල රංගනයේ යෙදීම සඳහා හෝ භාවිතා කිරීම, කුට්ටනය කිරීම හෝ ලබා දීම;

(ඇ) ළමයින්ව අයුතු ක්‍රියාවල යෙදවීම පිණිස විශේෂයෙන් අන්තර්ජාතික ලේඛනයන් හී සඳහන් කර තිබෙනා ආකාරයට මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට හෝ වෙළදාම් කිරීම පිණිස ළමයකු භාවිතා කිරීම කුට්ටනය කිරීම හෝ ලබා දීම;

(ඈ) අදාල ක්‍රියාවේ ස්වභාවය සහ එය සිදුකරනු ලබන තත්ත්වයන් හේතු කරගෙන ළමයින්ගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හා සදාචාරයට හානිකර වැඩ.

අංක 182 සම්මුතිය මඟින් රාජය පාර්ශවයන්ගෙන් එම සම්මුතියේ අදාල ප්‍රතිපාදනයන්ට බලාත්මකභාවය ලබා දෙන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සහ සැලසුම් කිරීම අපේක්ෂා කරනු ලබයි.(5 වන ව්‍යවස්ථාව).

අංක 182 සම්මුතිය අනුව, පාර්ශවකාර රාජ්‍යයන් ඉතා නරක ස්වභාවයේ ළමා ශ්‍රමය ලබා ගැනීම මුලිනුපුටා දැමීමට අවශ්‍ය වැඩසටහන් ප්‍රමුඛතාවය සහිතව සැලසුම් කර ඒවා ක්‍රියාත්මක කළ යුතු අතර එසේ කිරීමේ දී ගැහැණු ළමුන්ගේ සුවිශේෂී තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.(6 වන ව්‍යවස්ථාව). වැරදි සඳහා දණ්ඩන හෝ වෙනත් තහංචි සඳහා වන විධිවිධාන පිළිබදව ද අවධානය යොමු කළ යුතු ය.

43 http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/SupplementaryConventionAbolitionOfSlavery.aspx
44 http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C182

### 4.8.3 1999 ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය පිළිබද අන්තර්ජාතික කම්කරු සංවිධානයේ නිර්දේශයන් (අංක.190) (ILOR No 190)

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ නිර්දේශ අංක 190හි විධිවිධානයන් මඟින් අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 182 ඌණපූරණය කරනු ලබයි.[45] අන්තර්ජාතික කම්කරු සංවිධානයේ නිර්දේශ අංක 190 1999 ජුනි 17 වන දින පිළිගනු ලැබූ අතර එය අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 182 හි 6 වන ව්‍යවස්ථාව තුළ සඳහන් කර ඇති ආකාරයට කාර්ය වැඩසටහන් සම්බන්ධයෙන් වැඩිදුර විස්තරයන් සපයනු ලබයි. විශේෂයෙන්, වැඩසටහන් සැලැස්ම සහ බලාත්මක කිරීම අරමුණු කරනු ලැබූයේ:

අ) ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය හදුනාගැනීම සහ එය පිටුදැකීම;

ආ) ළමුන් ඉතා නරක ආකාරයේ ශ්‍රමය ලබා දීමෙන් වැළැක්වීම සහ එවැනි අවස්ථාවන්ගෙන් ඔවුන්ව ඉවත් කර ගැනීම, ඔවුන්ව පළිගැනීම්වලින් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, භෞතික සහ මානසික අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කරනු ලබන ආකාරයේ පියවරයන් හරහා ඔවුන්ගේ පුනරුත්ථාපනයට සහ නැවත සමාජගත කිරීමට අවශ්‍ය කරන විධිවිධාන සැපයීම;

ඇ) පහත ද සඳහා විශේෂ අවදානය යොමු කිරීම:
  අ. බාලවයස්කාර දරුවන්
  ආ) ගැහැණු දරුවන්

ඈ) ගැහැණු දරුවන් විශේෂයෙන් අවධානමට ලක්වන සැඟවුන කාර්යන් පිළිබද ගැටළු

ඉ) විශේෂ අසරණතා සහ අවශ්‍යතා සහිත සෙසු කාණ්ඩවල ළමුන්

ඊ) ළමුන් විශේෂයෙන් අවධානමට ලක්වන සමාජ කණ්ඩායම් හඳුනාගැනීම, ඔවුන් වෙත ළඟාවීම සහ ඔවුන් සමඟ කටයුතු කිරීම

උ) මහජන මතය සහ ළමුන් සහ ඔවුන්ගේ පවුල් ද ඇතුළු අදාල කණ්ඩායම් දැනුවත් කිරීම, සංවේදි කිරීම සහ දැනුවත්භාවය වර්ධනය කිරීම

### 4.8.4 1973 අන්තර් ජාතික කම්කරු සංවිධානයේ අවම වයස පිළිබඳ සම්මුතිය (අංක.138) (ILOC No 138)

අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 138 යනු අන්තර් ජාතික කම්කරු සංවිධානය මඟින් 1978 දී පිළිගත් සම්මුතියකි.[46] එමඟින් පාර්ශවකාර රාජ්‍යයන් විසින් ළමා ශ්‍රමය ඵලදායී ලෙස තුරන් කර දැමීම තහවුරු කිරීම පිණිස සැකසූ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සහ තරුණ තැනැත්තන්ගේ පූර්ණ ශාරිරික හා මානසික වර්ධනය හා සැසඳෙන මට්ටමකට රැකියාවකට හෝ වැඩකට ඇතුලත් කර ගැනීමේ අවම වයස සාධනීය ලෙස ඉහළ නැංවීමට පියවර ගැනීම අපේක්ෂා කරනු ලබයි. (11 වන ව්‍යවස්ථාව). අන්තර් ජාතික කම්කරු සංවිධාන සම්මුති අංක 138 ශ්‍රමය සම්බන්ධ ක්ෂේත්‍රයේ සමාන සම්මුතීන් ගණනාවක් පරිච්චින්න කරනු ලබයි.[47]

අවම වශයෙන් අවුරුදු 15 රදවා ගනිමින් ශ්‍රමය සදහා අවම වයසක් නියම කිරීමට රටවලට නිදහස තිබේ. (2(3) ව්‍යවස්ථාව). කෙසේ වුවද 4 වන ව්‍යවස්ථාව දක්වන්නේ ආර්ථික හා අධ්‍යාපනික පහසුකම් ප්‍රමාණවත් තරම් වර්ධනය වී නොමැති සාමාජික රාජ්‍යයන්ට සේවක සංගම් හා අදාල සේවකයින් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව පළමු අවස්ථාවේ දී අවම වයස අවුරුදු 14 බව දක්විය හැකිය.

නීතිය මඟින් අවුරුදු 13-15 අතර ළමයින් සදහා සැහැල්ලු වැඩ නියම කළ හැකිය. (ඔවුන්ගේ සෞඛ්‍යයට හා පාසල් වැඩවලට හානිකර නොවන). තරුණ පුද්ගලයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සදාචාරයට හානිකර විය හැකි ආකාරයේ කාර්යයන් සඳහා අවම වයස ලෙස අවුරුදු 18 වන අතර එය සේවක සංගම් සහ අදාල සේවකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව නියම කල හැකිය. (3 වන ව්‍යවස්ථාව)

ශ්‍රී ලංකාව අංක 138 සම්මුතිය 2000 පෙබරවාරි 11 වන දින, වැඩකිරීම සදහා වන අවම වයස අවුරුදු 14 වශයෙන් පදනම් කර ගනිමින් අපරානුමත කරන ලදී.

---

45 http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:R190

46 http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C138

47 Minimum Age (Industry) Convention, 1919, the Minimum Age (Sea) Convention, 1920, the Minimum Age (Agriculture) Convention, 1921, the Minimum Age (Trimmers and Stokers) Convention, 1921, the Minimum Age (Non-Industrial Employment) Convention, 1932, the Minimum Age (Sea) Convention (Revised), 1936, the Minimum Age (Industry) Convention (Revised), 1937, the Minimum Age (Non-Industrial Employment) Convention (Revised), 1937, the Minimum Age (Fishermen) Convention, 1959, and the Minimum Age (Underground Work) Convention, 1965.

### 4.8.5 1930 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳ සම්මුතිය (No.29) (ILOC No 29)

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අංක 29 දරන සම්මුතියේ 2 වන ව්‍යවස්ථාව මගින් බලහත්කාරයෙන් හෝ අනිවාර්ය සේවයේ යෙදවීම යන්න පහත පරිදි නිර්වචනය කර තිබේ. "යම් පුද්ගලයකුව දඩුවමකට යටත් කරන බවට තර්ජනය කර ඔහු විසින් ස්වේච්ඡාවෙන් ලබා දෙනු නොලැබූ සියලු ම ආකාරයේ කාර්යයන් සහ සේවාවන්" කෙසේ වුවද ඒ සඳහා ව්‍යතිරේඛයන් දක්වා තිබේ.

- සම්පූර්ණයෙන් හමුදාමය ස්වභාවයක් ගනු ලබන හමුදා සේවයට ඇතුලත් සේවාවන්;
- සාමාන්‍ය පුරවැසි වගකීම් ඉටුකිරීම;
- අධිකරණයක් මගින් නියම කරනු ලැබූ දඩුවමක් වශයෙන් ඉටුකල යුතු කාර්යයන්
- සුළු ප්‍රජා සේවාවන් හෝ
- හදිසි අවස්ථා තත්ත්වයකදී සිදුකරනු ලබන ඕනෑම කාර්යක්.

මෙම සම්මුතියේ 1(1) වන ව්‍යවස්ථාව දක්වන්නේ මෙම සම්මුතිය අපරානුමත කළ අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සෑම සාමාජිකයකුම හැකි කෙටි ම කාලයක් තුල සියලු ම ආකාරයේ බලහත්කාරී හෝ අනිවාර්ය සේවය ලබා ගැනීම් නැතිකර දැමීමට පියවර ගත යුතු බවයි. ශ්‍රී ලංකාව මෙම සම්මුතිය 1950 අප්‍රේල් 5 වන දින අපරානුමත කරන ලදී.[48] බලහත්කාරයෙන් සේවයේ යෙදවීම සහ තැනැත්තන් වෙළඳාම් කිරීම අතර සබඳතාවය එහි අරමුණ සඳහා වන නිර්වචනයේ ඇති සූරාකෑම යන වචනය සමඟ බැදී පවතී. සූරාකෑම යන්න බලහත්කාරයෙන් ශ්‍රමය හෝ සේවාවන් ලබා ගැනීම වහල්භාවය සහ ඒ හා සමාන ක්‍රියා පරවශතාවය සහ විවිධ ආකාරයේ ලිංගික සූරාකෑම් යන්න විශේෂයෙන් ඇතුළත් කිරීම සඳහා නිර්වචනය කර තිබේ. මෙම නිර්වචනයට අනන්‍ය ශ්‍රම සූරාකෑම යන්න පැලමෝර් සංධානය සහ අංක 29 සම්මුතිය අතර සබඳතාවය ඇති කිරීමෙහි ලා හැකියාව ලබා දේ.

## 4.9 1966 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබද අන්තර්ජාතික සම්මුතිය අන්තර්ජාතික මානව හිමිකම් සම්බන්ධයෙන් වන මුල් ගලකි.[49] එමගින් වහල්භාවය සහ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම තහනම් කරනු ලබයි. එම 8 වන ව්‍යවස්ථාව පහත පරිදි දක්වයි:

- කිසිම තැනැත්තකු වහල්භාවයට පත්කළ නොහැකි ය. වහල්භාවය සහ සියලු ම ආකරයන් හී වහල් වෙළදාම තහනම් වේ.(1 වන ව්‍යවස්ථාව)
- කිසිදු තැනැත්තකු දාසභාවයේ රඳවාගත නොහැකි ය. (2 වන ව්‍යවස්ථාව)
- කිසිදු තැනැත්තකුට බලහත්කාරයෙන් හෝ අනිවාර්ය සේවයේ යෙදීමට බල නොකළ යුතු ය.(3අ ව්‍යවස්ථාව)

මෙම සම්මුතිය බොහෝ රටවල අයිතිවාසිකම් පනත්වල පදනම වන අතර මූලික මානව හිමිකම් උල්ලංඝණය කරනවාය යන පදනම මත වහල්භාවය සම්බන්ධ පරිචයන් තහනම් කරන ලද පරිචයන් වේ.

## 4.10 විදේශගත ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1990) (විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය)

විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය මගින් විදේශගත ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, තමන්ගේ මව්රටින් බැහැරව සේවය කිරීම හේතුවෙන් සූරාකෑමට ලක්විය හැකි පිරිසක් බවට පිළිගනු ලබන අතර ඔවුන්ට සැලකීම පිළිබද මූලික මූලධර්මයන් පිළිගනු ලබන නියාමයන් ස්ථාපනය කරනු ලබයි. එමගින් තවදුරටත් ඔවුන් මව් රටින් බැහැර සිටීම හේතුකර ගෙන සහ වත්මන් සේවා නියුක්තියේ තත්ත්වයන් හේතුකරගෙන මුහුණ පෑ හැකි අසරණතාවලට එරෙහිව ඔවුන්ව ආරක්ෂා කිරීමට අරමුණු කරනු ලබයි.

[48] http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C029
[49] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CCPR.aspx

විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය එහි අනෙකුත් විධිවිධානයන් අතර, වධහිංසාව, කෲර අමානුෂීය හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම් වැළැක්වීම, වහල්භාවය හා පරවශතාවය, බලහත්කාරයෙන් හෝ අනිවාර්ය සේවයේ යෙදවීම, අනවසර තැනැත්තන් විසින් අනන්‍යතා ලේඛන බලහත්කාරයෙන් ලබා ගැනීම හා විනාශ කර දැමීම යනාදිය වැළැක්වීම තහවුරු කරනු ලබයි. එය තවදුරටත් විදේශගත ශ්‍රමිකයින්ගේ ඔවුන්ගේ පුද්ගලිකත්වයේ හා දේපළවල නිදහස හා ආරක්ෂාව, අත්තනෝමතික සිරභාරයට ගැනීමෙන් ආරක්ෂාව, අදාළ රාජ්‍යයේ ජාතිකයන් හා සමානතාවය ලැබීමට අයිතිය, සහ ස්වකීය මව් රාජ්‍යයේ තානාපති හෝ කොන්සල් සේවාවන් හී ආරක්ෂාව හා සහය ලබා ගැනීමට යොමු වීම යනාදිය තහවුරු කිරීමට උත්සහ කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින් මෙම සම්මුතිය 1996 දී අපරානුමත කරන ලදී. [50]

## 4.11 අන්තර්ජාතික මාර්ගෝපදේශ සහ මූලධර්ම

### 4.11.1 මානව හිමිකම් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයට මානව හිමිකම් හා තැනැත්තන් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කරන ලද මූලධර්ම හා මාර්ගෝපදේශල ජිනීවාල 2002 (මානව හිමිකම් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයේ තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය)[51] (OHCHR)

මානව හිමිකම් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයේ තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය සකස් කරනු ලැබුයේ තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීමට සහ වින්දිතයන් ආරක්ෂා කිරීම පිණිස ප්‍රායෝගික අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රතිපත්ති මාලාවක් සැකසීම උදෙසා ය.

මෙම ලේඛනය තුල මාර්ගෝපදේශ 11ක් ඇතුලත් වන අතර එහි අරමුණ වන්නේ අන්තර්ජාතික, කලාපීය සහ දේශිය තැනැත්තන් වෙළඳාම් කිරීම්වලට අදාල නීතීන්, ප්‍රතිපත්තීන් හා වෙනත් මැදිහත්වීම් තුලට මානව හිමිකම් පැතිකඩක් අන්තර්ග්‍රහණය කිරීම ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම ය.

### 4.11.2 යුනිසෙෆ් (UNICEF): තැනැත්තන් වෙළඳාම් කිරීමේ ළමා වින්දිතයකු ආරක්ෂා කිරීම සදහා වන මාර්ගෝපදේශයල නිව්යෝර්ක්ල 2006 (ළමා වෙළඳාම පිළිබඳ යුනිසෙෆ් මාර්ගෝපදේශය)[52]

ළමා වෙළඳාම පිළිබඳ යුනිසෙෆ් මාර්ගෝපදේශය මඟින් තැනැත්තන් වෙළඳාමට ලක්වූ ළමුන් සම්බන්ධයෙන් ආරක්ෂාව සහ සහය ලබා දීම සඳහා වන යහපත් පරිචයන් පිළිබඳ ප්‍රමිතීන් සඳහන් කරනු ලබයි. මෙම මාර්ගෝපදේශය අන්තර්ජාතික මානව හිමිකම් ලේඛනයන් මත පදනම් වී ඇති අතර හඳුනා ගැනීමේ සහ මුදවාගෙන නැවත සමාජගත කරන තුරු ළමා වින්දිතයන්ගේ ආරක්ෂාව පිළිබඳ විමසා බලයි. ළමා වෙළඳාම පිළිබඳ යුනිසෙෆ් මාර්ගෝපදේශය, ජාතික හා කලාප මට්ටමින්, ඒ ඒ දේශිය තත්ත්වයන්, සීමාවන් හා සම්පත් සැලකිල්ලට ගනිමින් ප්‍රතිපත්තීන් හා පරිචයන් නිර්මාණය කිරීමේ වේදිකාවක් වශයෙන් භාවිතා කිරීම අපේක්ෂා කරනු ලබයි. මෙම මාර්ගෝපදේශය හරහා ළමා වින්දිතයන් ආරක්ෂා කිරීම පිණිස ආණ්ඩුවට, රාජ්‍ය අංශයේ හා අන්තර්ජාතික සංවිධානයන්ට මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන් හෝ සේවා සපයන ආයතනයන්ට උපකාර කිරීම අරමුණු කරනු ලබයි.

### 4.11.3 යුනිසෙෆ් (UNICEF): යුරෝපයේ තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක් වූ ළමුන් ආරක්ෂා කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ ජිනීවා, 2006



**ඉගෙනුම් මෙවලම්:**

**අන්තර්ජාතික ලේඛනයන්**
**අත්සන් කිරීම, අපරානුමත**
**කිරීම සහ ඇද ගැනීම**

[50] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CMW.aspx
[51] http://www.ohchr.org/Documents/Publications/Traffickingen.pdf
[52] https://www.unicef.org/eca/0610-Unicef_Victims_Guidelines_en.pdf

| | |
|---|---|
| **අත්සන් කිරීම යන්න අපරානුමත කිරීමට හෝ පිළිගැනීමට හෝ අනුමත කිරීමට යටත්වේ.** | අත්සන් කිරීම යන්න අපරානුමත කිරීමට හෝ පිළිගැනීමට හෝ අනුමත කිරීමට යටත් වන අවස්ථාවක දී අත්සන් කිරීම යන්නෙන් එකී ලේඛනයට නෛතික බැඳීමට ඇති කැමැත්ත ස්ථාපනය නොකරයි. කෙසේ වුවද, එමගින් අත්සන් කරන ලද රාජ්‍යය තවදුරටත් සම්මුති සකස් කිරීමේ ක්‍රියාවලියේ ඉදිරියට යාමට ඇති කැමැත්ත ප්‍රකාශ කරනු ලබන බව අර්ථ ගැන්වේ. අත්සන හරහා එම රාජ්‍යයට එකී ලේඛනය අපරානුමත කිරීමට හෝ පිළිගැනීමට හෝ අනුමත කිරීමට හැකියාව ඇති කරයි. එමගින් තවදුරටත් සද්භාවයෙන් යුතුව අදාල සම්මුතියේ අභිමතාර්ථය සහ අරමුණ පරාජය කරන ආකාරයේ ක්‍රියාවන් කිරීමෙන් වැළකී සිටීමේ වගකීමක් නිර්මාණය කරනු ලබයි.<br>(1969 සම්මුති නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 10 සහ 18 වන ව්‍යවස්ථාවන් ) |
| **අපරානුමත කිරීම** | අපරානුමත කිරීම යනුවෙන් අදහස් වන්නේ යම්කිසි සම්මුතියකින් නෛතිකව බැඳීම පිණිස යම් රාජ්‍යයක් විසින් කැමැත්ත පිළිබිඹු කරනු ලබන අන්තර්ජාතික ක්‍රියාවකි. (එම ක්‍රියාව හරහා පාර්ශවයන් ඔවුන්ගේ කැමැත්ත පෙන්වීමට චේතනා කරයි නම්). ද්වි පාර්ශවීය ගිවිසුමක් නම් අදාල පාර්ශවයන් දෙක ලේඛනයන් හුවමාරු කර ගැනීම හරහා අපරානුමතය ලබා ගන්නා අතර බහු පාර්ශවීය සම්මුතියක දී නම් සාමාන්‍ය ක්‍රියාපටිපාටිය වන්නේ අවශ්‍ය කරන අපරානුමිතීන් ලබා ගැනීම පිණිස සියලු රාජ්‍යයන් දැනුවත් කර අදාල ලේඛනය යම් ස්ථානයක තැම්පත් කර තැබීමයි. අපරානුමිතිය මගින් දේශීය මට්ටමින් අවශ්‍ය කරන අනුමැතිය ලබා ගැනීම පිණිස රාජ්‍යයන් වෙත කාලය ලබා දෙන අතර එම සම්මුතියට දේශීය නීතිය තුළ බලාත්මකභාවය ලබා දීමට අවශය කරන ව්‍යවස්ථාවන් සම්පාදනය කිරීමට කාලය ලබා දේ.<br>(1969 සම්මුති නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 2 (1) (ආ), 14 (1) සහ 16 වන ව්‍යවස්ථාවන් ) |
| **ඇදාගැනීම** | ඇදා ගැනීම හරහා දැනටමත් සෙසු රාජ්‍යයන් සාකච්ඡා කර අත්සන් තබන ලද සම්මුතියක පාර්ශවකාරයෙකු වීමට වන ආරාධනයක් රාජ්‍යයක් විසින් පිළිගනු ලබන අවස්ථාවක් පිළිබිඹු වේ. මෙහිදී ද අපරානුමිතය හා සමාන ම නෛතික ප්‍රතිඵලයන් ඇති වේ. මෙය සාමාන්‍යයෙන් සිදු වන්නේ දැනටමත් සම්මුතිය ක්‍රියාත්මක වීම ආරම්භ වී ඇති අවස්ථාවන් හිදී ය.<br>(1969 සම්මුති නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 2 (1) (ආ), සහ 15 වන ව්‍යවස්ථාවන් ) |

**අභ්‍යාසය 4.1**

**අන්තර්ජාතික ලේඛනයන්ගෙන් පහත දැක්වෙන එක් ව්‍යවස්ථාවක් තෝරාගෙන එය විස්තර කරන්න:**

1. එය තැනැත්තන් වෙළදාම් කිරීමට එරෙහි කාර්යයන් හී වැදගත් උපකරණයක් වන්නේ කෙසේද?

**අන්තර්ජාතික ලේඛන අදාල කර ගැනීම**

***අ. පැලමෝර් සංධානය (5 වන ව්‍යවස්ථාව):***

"1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින් ම මෙම සංධානයේ 3 වන ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති ක්‍රියාවන් චේතනාන්විතව සිදුකරනු ලැබ තිබෙන අවස්ථාවන් අපරාධ වැරදි වශයෙන් හඳුනාගැනීමට අවශ්‍ය කරන පරිදි ව්‍යවස්ථාමය හෝ වෙනත් පියවරයන් ගතයුතුය.

"2. සෑම රාජ්‍ය පාර්ශවයක් ම මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය අනුව සංස්ථාපනය කරන ලද වරදකට සහයකයකු වශයෙන් සම්බන්ධ වීම අපරාධමය වරදක් ලෙස ස්ථාපනය කිරීමට අවශ්‍ය කරන පරිදි ව්‍යවස්ථාමය හෝ වෙනත් පියවරයන් ගත යුතු ය.

***ආ. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1989) (34 වන ව්‍යවස්ථාව):***

"ළමයාව සියලු ම ආකාරයේ ලිංගික සූරාකෑම් හා ලිංගික අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමට රාජ්‍ය පාර්ශවයන් වගකීම බාරගනු ලැබේ. මෙකී අරමුණු සඳහා, රාජ්‍ය පාර්ශවයන් විසින් පහත දෑ වැළැක්වීම පිණිස විශේෂයෙන් සුදුසු සියලු ම ජාතික, ද්විපාර්ශවීය හා බහු

| | |
|---|---|
| 2. එය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නංවා තිබෙන්නේ කෙසේද? හැකි අවස්ථාවන් හී දී ඔබගේ පෞද්ගලික හෝ වෘත්තීය අත්දැකීම් ඇසුරින් උදාහරන භාවිතා කරන්න. | පාර්ශවීය ක්‍රියාපටිපාටීන් ගත යුතුය: ...(ආ) ළමයින්ව වෛශ්‍ය වෘත්තියේ හෝ වෙනත් ආකාරයන් හී නීතිවිරෝධී ලිංගික පරිචයන් හී භාවිතා කිරීම...”<br>***ඇ. අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය පිළිබඳ සම්මුතිය, 1999 (අංක.182) (7(2)ව්‍යවස්ථාව):***<br>“සෑම පාර්ශවකාර රාජ්‍යයක් ම ළමා ශ්‍රමය තුරන් කිරීමෙහි ලා අධ්‍යාපනය ලබා දීමේ වැදගත්බව සැලකිල්ලට ගනිමින් (අ) ළමයින් ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය ලබාදීමේ ආකාරයන්හී නිරත වීම වැළැක්වීම පිණිස...ඵලදායී සහ නිශ්චිත කාලපරාසයක් තුල පියවරයන් ගත යුතු ය.”<br>***අවම වයස පිළිබඳ සම්මුතිය, 1973 (අංක.138) (3 වන ව්‍යවස්ථාව):***<br>“1.තරුණ පුද්ගලයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සදාචාරයට හානිකර විය හැකි කුමන හෝ ආකාරයේ සේවා නියුක්තීන් හා කාර්යයන් සඳහා අවම වයස ලෙස අවුරුදු 18 විය යුතු ය.” |
| **අභ්‍යාසය 4.2** | **ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම** |
| පහත අවස්ථාවන් සලකා බලන්න. එ.ජා ළමා අයිතිවාසිකම් සම්මුතිය ප්‍රකාරව කවර අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇත්දැයි (එසේ වී ඇත්නම්) සාකච්ඡා කරන්න.[53] | A. අර්ජුන තම ගොවි දෙමාපියන් සමඟ ගොවිපලක ජීවත් වන වයස අවුරුදු 11ක පිරිමි ළමයෙකි. ඔහුගේ පියා අසනීප වූ අතර ඔහුගේ පවුල ගොවිපලේ හිමිකරුගෙන් ණයට මුදල් ලබා ගන්නා ලදී. එය නැවත පියවා දැමීම පිණිස අර්ජුන අදාල පුද්ගලයාගේ මෙහෙකරු වහයෙන් සේවය කිරීම ආරම්භ කරන ලදී.<br><br>B. දුර්භික්ෂයට ලක්වූ දුප්පත් ග්‍රාමීය ප්‍රදේශයක් ජීවක් වන බිම්බා වයස අවුරුදු 10 ක ගැහැණු ළමයෙකි. අගනගරයේ වෙසෙන ඇයගේ ධනවත් නැන්දනිය පවසන්නේ බිම්බා ඇයගේ නිවසේ කාර්යයන් සඳහා උපකාර වන්නේ නම් බිම්බාට ඇය සමග පැමිණ ජීවත් විය හැකි බවයි. නැන්දණිය ඇයව පාසල් යැවීමට පොරොන්දු වේ. මෙම තත්ත්වය මෙම ගැහැණු ළමයා වෙසෙනෙ ප්‍රදේශයේ සාමාන්‍ය තත්ත්වයකි: මෙම රටතුල තමන්ගේ විශාල පවුලේ අවශ්‍යතාවයන් පිරිමැසීම පිණිස ස්වකීය ඥාතීන් සමඟ දරුවන් යැවීම සාමාන්‍ය සම්ප්‍රදායයි.<br><br>C. චින්තක K නම් රාජ්‍යයේ සිට වයස අවුරුදු 10-12 පමණ වන බව සිට ගෙනා පිරිමි ළමයකු වන අතර ඔහුගේ පෙනුම ඊට වඩා බොහෝ ළාබාල වේ. (අවුරුදු 7-8 ක් පමණ). J රාජ්‍යයේ පොලිසිය විසින්, ඔහු තවත් රටවල් දහයක පමණ ළමුන් සමග වෙළඳපොළේ කුඩා භාණ්ඩ අලෙවි කරමින් සිටින අවස්ථාවේ දී භාරයට ගන්නා ලදී. පැය දෙකක පමණ විමර්ශනයකින් පසුව ළමයා ඇත්තවශයෙන්ම J රාජ්‍යයේ ස්වකීය පවුල සමඟ ජීවත් වන බව පොලිසිය අනාවරණය කර ගන්නා ලදී. එම පවුලට නීත්‍යානුකූල අවසර තිබුන ද නැති ද යන්න පැහැදිලි නොවීය. ඔහුව පාසලකට ඇතුලත් කර තිබුන ද චින්තක වැඩිම කාලයක් වෙළඳපොළේ ගත කරනු ලබන්නේ හවසට තම දෙමාපියන්ට සුළු මුදලක් ගෙනැවිත් දීම සඳහාය. |

[53] Source: *Training manual to fight trafficking in children for labour, sexual and other forms of exploitation / International Labour Office, International Programme on the Elimination of Child Labour (IPEC). - Geneva: ILO, 2009 - 4 v.*

D. හේෂානි T රාජ්‍යයේ සිට පැමිණි අවුරුදු 14 ක දැරියක් වන අතර ඇය තම සහෝදරයා විසින් එම රාජ්‍යයේ මධ්‍ය ප්‍රදේශයේ සිට එහි දකුණු ප්‍රදේශයට රැගෙන ඒම පිණිස කැමැත්ත පළ කර තිබිණි. ඇය තම සහෝදරයා සහ නැනා සමග Z රාජ්‍යයේ දේශසීමාව අසල දකුණු ප්‍රදේශයේ ජීවත් වේ. සෑම දිනක ම තම සහෝදරයා හඳුන්වා දෙනු ලැබූ තෙවන පාර්ශවයන්ට පළතුරු සහ බිත්තර විකිණීම පිණිස ඇය නීති විරෝධී ලෙස දේශසීමාව තරණය කරයි. හේෂානි පාසල් නොයයි. Z රාජ්‍යයේ කම්කරු පනත අනුව ඇය එහි පුරවැසියෙකු නම් ඇයට අන්තරාකර නොවන වැඩ කිරීමට අවසර දිය හැකි ය. ඇයගේ ආදායම් පිළිබඳ හේෂානි බොහෝ සතුටින් සිටියි. සෑම සතියකම ඇය තම කැමැත්තෙන් ඇගේ සහෝදරයාට තම දෛනික වියදම් ආවරණය කිරීමට යම් මුදලක් ලබා දේ.

## b. කලාපීය නෛතික රාමුව


**කාන්තාවන් සහ ළමයින් වෛශ්‍යා වෘත්තියේ යෙදවීම වැළැක්වීමට සහ ඊට එරෙහිව සටන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ සම්මුතිය (1997) (තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය) සහ ළමා සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන කලාපීය විධිවිධාන පිළිබඳ සාර්ක් සම්මුතිය. (ළමා සුභසාධනය පිළිබඳ සාර්ක් සම්මුතිය)**

SAARC

**හැඳින්වීම**

තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය[54] සහ ළමා සුභසාධනය පිළිබඳ සාර්ක් සම්මුතිය[55] 11 වන සාර්ක් සමුළුවේ දී 2002 ජනවාරි මාසයේ 5 වන දින අත්සන් තබන ලදී (කත්මණ්ඩු 2002 ජනවාරි 4-6). මෙම සම්මුතිය එතැන් පටන් බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව විසින් ඒකමතිකව පිළිගත් අතර කාන්තාවන් සහ ළමුන් වෛශ්‍ය වෘත්තියේ යෙදවීම වැළැක්වීම, තහනම් කිරීම සහ මර්දනය කිරීමේ විවිධ පැතිකඩයන් සඳහා සහ නැවත මව් රටට යැවීම හා වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් සියලු ම පාර්ශවකාර රාජ්‍යයන්ගෙන් සහයෝගීත්වය අපේක්ෂා කර සිටියි.

### 4.12 සාර්ක් සම්මුතිය පැහැදිලි කිරීම




54 http://un-act.org/publication/view/south-asian-association-for-regional-cooperation-saarc-convention-on-preventing-and-combating-trafficking-in-women-and-children-for-prostitution-2002/

55 http://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---sro-new_delhi/documents/genericdocument/wcms_251025.pdf

අ) "තැනැත්තන් වෙළඳාම් කිරිමට යටත් වූ පුද්ගලයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව, මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා රට තුල හෝ ඉන් පිටත, වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් හා ළමයින් එහා මෙහා ගෙනයාම, විකිණිම හෝ මිලදී ගැනීම";

ආ) වෛශ්‍ය වෘත්තීය යනු වාණිජ අරමුණක් සඳහා තැනැත්තකු ලිංගික වශයෙන් සූරාකෑම හෝ අපයෝජනයට ලක්කිරීම වේ.;

ඇ) "තැනැත්තන් වෙළඳාම් කිරිමට යටත් වූ පුද්ගලයා යනු රැවටීම, තර්ජනය, බලහත්කාරය, පැහැරගෙන යාම, විකිණිම, වංචනික විවාහයන්, ළමා විවාහයන් හෝ වෙනත් ඕනෑම නීති විරෝධී ආකාරයකින් තැනැත්තන් වෙළඳාම් කරන්නන් විසින් වින්දිතයන් බවට පත් කරන ලද හෝ වෛශ්‍යා වෘත්තියේ යොදවන ලද කාන්තාවන් සහ ළමුන් වේ;

ඈ) තැනැත්තන් වෙළඳාම්කරුවන් යනු සියලු ම ආකාරයේ තැනැත්තන් වෙළඳාම් කිරීමවල යෙදී සිටින පුද්ගලයන්,නියෝජිතයින් හෝ ආයතනයන් වේ.;

ඉ) ළමයා යනු වයස අවුරුදු 18 අඩු පුද්ගලයෙකි.

**සාර්ක් සම්මුතියේ**
**1 වන ව්‍යවස්ථාව මඟින්**
**තැනැත්තන් වෙළඳාම් කිරීම**

| | |
|---|---|
| **11 ව්‍යවස්ථාව** | මෙමඟින් තමන්ගේ රාජ්‍යයන් හී තැනැත්තන් වෙළඳාම් කිරීම අපරාධමය වරදක් බවට පත් කිරීම පිණිස ව්‍යවස්ථාවන් සම්පාදනය කිරීම පිණිස කාර්යක්ෂම පියවර ගැනීමට පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට යටත් කරයි. |
| **IV ව්‍යවස්ථාව** | අධිකරණයන් විසින් සලකා බැලියයුතු, අපරාධය බරපතල බවට පත්කිරීම පිණිස බලපාන අවස්ථාපිත සාධකයන් සඳහන් කරයි. ඒවා නම්:<br>අ. සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සම්බන්ධ වීම;<br>ආ. වරදකරු වෙනත් අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ ක්‍රියාවන්හි නිරත වීම;<br>ඇ. වරදකරු විසින් ප්‍රචණ්ඩත්වය හෝ ආයුධ භාවිතා කිරීම;<br>ඈ. වරද සිදුකිරීම පිණිස මහජන ධූරයක් අයුතු ලෙස භාවිතා කිරීම;<br>ඉ. ළමයින්ව වින්දිතයින් බවට පත්කිරීම හෝ වෙළඳාම් කිරීම;<br>ඊ. භාරකාරත්ව ආයතනයක දී, අධ්‍යාපනික ආයතනයක දී හෝ සමාජමය පහසුකම් සපයනු ලබන ආයතනයක දී වරද සිදුකිරීම;<br>උ. මේ හා සමාන වැරදි සඳහා පෙර වරදකරුවන් වී තිබීම. |
| **V ව්‍යවස්ථාව** | තැනැත්තන් වෙළඳාම් කිරීමට නතු වූ කාන්තා හෝ ළමා වින්දිතයින්ගේ රහස්‍යභාවය තහවුරු කිරීමට සහ වින්දිතයින් වෙනුවෙන් නෛතික හා උපදේශන සේවා ලබා දීමට අවශ්‍ය විධිවිධාන සැලසීම තහවුරු කිරීමට පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට යටත් කරනු ලබයි. |
| **VI ව්‍යවස්ථාව** | පරීක්ෂණයන්, විමර්ශනයන්, නඩු විභාග සහ වෙනත් නඩු කටයුතු හිදී අන්‍යෝන්‍ය නෛතික සහය ලබා දීමට පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට ලක්කරයි. ඒ තුළ පහත ද අන්තර්ගත විය හැකිය:<br>අ. සාක්ෂි ලබා ගැනීම සහ පුද්ගලන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීම;<br>ආ. තොරතුරු, ලේඛන සහ අපරාධ සහ අධිකරණ වාර්තා ද ඇතුළුව වෙනත් වාර්තා ලබා දීම;<br>ඇ. ඔවුන්ගේ අනන්‍යතාවය ද ඇතුළුව පුද්ගලයක් සහ භාණ්ඩ සොයා ගැනීම;<br>ඈ. සෝදිසි කිරීම් හා අල්ලා ගැනීම;<br>ඉ. ඉදිරිපත් කළ භාණ්ඩ ලබා දීම ද ඇතුළුව දේපළ භාරදීම (නඩු භාණ්ඩ);<br>ඊ. රැඳවියන් සහ වෙනත් සිටිනා අදාල පුද්ගලයන් මඟින් සාක්ෂි දීමට හෝ විමර්ශනයන්ට සහය වීමට සැලැස්වීම;<br>උ. පුද්ගලයන්ගේ පැමිණීමේ වාර්තා ඇතුළුව ලේඛන ලබා දීම |
| **VII ව්‍යවස්ථාව** | තැනැත්තන් වෙළඳාම් කිරීම උදර්පණීය වරදක් ලෙස පිළිගනු ලබන අතර පාර්ශවකාර රාජ්‍යයන්ට වරදකරුවන්ට ස්වකීය රාජ්‍ය තුල නඩු පැවරීමට හෝ වෙනත් සාමාජික රාජ්‍යයක් තුල නඩු පැවරීම පිණිස උදර්පණය කළ හැකි ය. |
| **VIII ව්‍යවස්ථාව** | කාන්තාවන් සහ ළමයින් තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක්කිරීම වැළැක්වීමට සහ තහනම් කිරීමට පියවර |